ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය எனது இல. My No.	ඔබේ අංකය உமது இல. Your No.	දිනය திகதி Date 2026.10.12

පැමිණිලි පාර්ශවය : ජී.එන්.එන්. සඳගල මයා
අංක 47/ඒ/05, සම්මන්ත්‍රණපුර, මට්ටක්කුලිය, කොළඹ 15.

අගතියටපත් පාර්ශවය : ජී. ඒ. විශ්ව තරණ සඳගල
අංක 47/ඒ/05, සම්මන්ත්‍රණපුර, මට්ටක්කුලිය, කොළඹ 15.

වගඋත්තර පාර්ශවය : 01. ප්‍ර. පො. ප. ආර්. ඒ. ආර්. ඩී. කරුණාරත්න මයා
ස්ථානාධිපති
පොලිස් ස්ථානය, මට්ටක්කුලිය. (වර්තමාන සේවා ස්ථානය මහනුවර)

02. පො. සැ. 53137 වී. එම්. ආනන්ද ගුණසේකර මයා
පොලිස් ස්ථානය, මට්ටක්කුලිය.

03. පො. කො. රි. 80765 එම්. එච්. ජේ. සකලසූරිය මයා
පොලිස් ස්ථානය, මට්ටක්කුලිය.

04. පො. සැ. 12104 ආර්. එස්. කේ. ඒ. ප්‍රියන්ත මයා
පොලිස් ස්ථානය, මට්ටක්කුලිය. (වර්තමාන සේවා ස්ථානය කොටහේන)

05. කා. පො. සැ. 3429 ටී. එම්. ඉනෝකා සුහාරිස් මිය
පොලිස් ස්ථානය, මට්ටක්කුලිය. (වර්තමාන සේවා ස්ථානය දෙමටගොඩ)

06. පො. කො. 24052 ආර්. ආර්. රාජපක්ෂ මයා
පොලිස් ස්ථානය, මට්ටක්කුලිය.

07. පො. සැ. 74719 ඩබ්. එම්. ආර්. එල්. විජේසිංහ මයා
පොලිස් ස්ථානය, මට්ටක්කුලිය. (වර්තමාන සේවා ස්ථානය මධ්‍යම අපරාධ විමර්ශන කාර්යාංශය, නාරාහෙන්පිට)

පැමිණිලි අංකය : HRC/HO/5160/24

පැමිණිල්ල :

ඉහත නම් සඳහන් පැමිණිලිකරු විසින් 2024.12.23 දිනැතිව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පහත පැමිණිල්ල යොමුකරමින් ප්‍රකාශ කර ඇත්තේ පැමිණිලිකරු, 2024.12.02 දින සවස 2.00 ට පමණ රාජකාරී කටයුත්තක් සඳහා කොල්ලුපිටිය ප්‍රදේශයට තමාගේ කාර්යාලයේ සිට පිටත් වූ බවත්, තමා කාර්යාලයෙන් පිටව යනවිට තමාගේ පුතා වන ජී. ඒ. විශ්ව තරණ සඳගල යන අය

ප්‍රධාන කාර්යාලය பிரதான அலுவலகம் Head Office	අංක 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ 04. இல. 14, ஆர். ஏ. டி. மெல் மாவத்தை, கொழும்பு 04. No. 14, R. A. De Mel Mawatha, Colombo 04.		
සභාපති தவிசாளர் Chairman	011 - 250 5451	ෆැක්ස් தொலைநகல் Fax	011 - 250 5541/74
ඊමේල් மின்னஞ்சல் E-mail	secretary@hrcsl.lk	දුරකථනය தொலைபேசி Telephone	94-11-250 5580 / 81 / 82
ලේකම් செயலாளர் Secretary	011 - 250 5521	ක්ෂණික துரித அழைப்பு Hotline	1996
වෙබ් இணையம் Web	www.hrcsl.lk		

තමාගේ කාර්යාලයේ රැඳී සිටි බවත්, සවස 4.45ට පමණ තමාට පුතාගෙන් ඇමතුමක් ලැබුණු බවත්, තමා ඇමතුමට සම්බන්ධ වූ පසු පුතා විසින් "තාත්තේ මට ගහනවා" යැයි කෑ ගසා ප්‍රකාශ කළ බවත්, "කවුද ගහන්නේ?" කියා තමා විමසූ විට ඊට පිළිතුරු ලැබීමට පෙර දුරකථනය විසන්ධි වූ බවත් ඊට පසු තමාගේ බිරිඳ තමාට ඇමතුමක් ලබාදී, "මට්ටක්කුලිය ෂෙඩ් එක ලඟ ප්‍රශ්නයක් වෙලා පුතාට පොලිසියෙන් ගහලා අරගෙන ගියා" යැයි දැනුම්දුන් බවත් ප්‍රකාශ කර ඇත. තමා හැකි ඉක්මණින් මට්ටක්කුලිය පොලිස් ස්ථානයට පැමිණි බවත්, තමා පැමිණෙන විට ඉනෝකා යන නිලධාරිනිය පුතා අසලටවී කුමක් හෝ කියමින් සිටි බවත්, ඒ අවට නිලධාරීන් පිරිසක් වටවී සිටිනු දුටු බවත් ප්‍රකාශ කර ඇත. තමා පුතා අසලට ගොස් පුතාගෙන් "මොකක්ද වුණේ?" යැයි විමසූ බවත්, එවිට පුතා විසින් "මේ නිලධාරීන් ඔක්කොම මට ගැහුවා" යැයි ප්‍රකාශ කළ බවත්, තමාගේ පුතාට පහරදී ඇති බව නිරීක්ෂණය වූ බැවින්, තමාගේ ජංගම දුරකථනය ගෙන පුතාගේ ඡායාරූපයක් ගැනීමට උත්සාහ කරනවිට සිවිල් ඇඳුමින් සැරසී සිටි ඉනෝකා නිලධාරිනිය තමාගේ දුරකථනය බලෙන් උදුරා ගත් බවත්, එවිට අනෙක් නිලධාරීන් තමාව අල්ලා ගත් බවත් එක් නිලධාරියෙකු විසින් තමාගේ ෂර්ට් එක ඉරා දැමූ බවත්, තමා පැළඳ සිටි උපැස් යුවළ බිම දමා කඩා දැමූ බවත්, එම නිලධාරීන් විසින් තමාට පහරදුන් බවත් පහරදී තමාව සිරමැදිරියට දැමූ බවත් ටික වෙලාවකට පසු තමාව ආපහු එළියට ගත් බවත්, ස්ථානාධිපතිතුමා තමාට ඔහුගේ රාජකාරී කාමරයට පැමිණෙන ලෙස කියා තිබූ බැවින් තමා ස්ථානාධිපතිතුමන් හමුවීමට ගිය බවත් තමා ස්ථානාධිපතිතුමාගෙන් පුතාව අත්අඩංගුවට ගැනීමට හේතු විමසා සිටි බවත්, තමාගේ හැඳුනුම්පත පෙන්වා තමන් පිළිබඳව හඳුන්වාදුන් බවත්, තමාගේ පුතාට පොලිස් නිලධාරීන් පහරදී ඇති බවත් එසේ පහරදීමට හේතුව කුමක්ද යන්න විමසා සිටි බවත්, පොලිස් නිලධාරීන් තමාට ද පහරදී තම උපැස් යුවළ ද කඩා දැමූ බව ස්ථානාධිපති වෙත ප්‍රකාශ කළ බව සඳහන් කර ඇත. එම අවස්ථාවේදී ස්ථානාධිපති විසින් උපැස් යුවලට අලාභය ඔහු විසින් ලබාදෙන බව ප්‍රකාශ කර එළියට යන ලෙස දැනුම්දී මෙම සිදුවීමට සම්බන්ධ වූ නිලධාරීන් දස දෙනා ස්ථානාධිවරයා රාජකාරී කාමරයට කැඳවූ බවත් එම අවස්ථාවේදී සිවිල් ඇඳුමින් සිටි ඉනෝකා නිලධාරිනිය ස්ථානාධිපතිතුමාගේ නිල කාමරයට නොගිය බවත්, මද වේලාවකට පසු රාජපක්ෂ නිලධාරියා පැමිණ ඉනෝකා නිලධාරිනියට කුමක් හෝ ප්‍රකාශ කරනු දුටු බවත්, පසුව ඉනෝකා නිලධාරිනිය ස්ථානාධිපතිතුමාගේ නිල කාමරයට ගොස් ස්ථානාධිපතිතුමාට "මූව එළියට යවන්න එපා යැව්වොත් ප්‍රශ්නයක් වෙනවා" යැයි ප්‍රකාශ කරනු තමාට ඇසුනු බවත් සඳහන් කර ඇත. එම ප්‍රකාශයෙන් පසු නිලධාරියෙක් පැමිණ තමාට සිර මැදිරිය අසල බංකුවේ වාඩිවී සිටින ලෙසට දැනුම්දුන් බවත්, එවිට සිය පුත්‍රයා සේම තමාව ද පොලිසිය විසින් අත්අඩංගුවට ගෙන ඇති බව දැනගත් බවත් එදින රාත්‍රියේ තමාගෙන් කටඋත්තරයක් ලබාගත් බවත්, තම පුත්‍රයාගෙන් කිසිදු කටඋත්තරයක් ලබානොගත් බවත්, ඊට පසු දින එනම් 2024.12.03 වන දින තමා සහ පුත්‍රයා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත රැගෙන ගොස් ඡායාරූප ලබාගෙන, අධිකරණය වෙත රැගෙන ආ බවත්, අධිකරණයට රැගෙනවිත් එහි තිබූ සිර මැදිරියට තමන් දෙදෙනා දැමූ බවත්, යළිත් ඉන් ඉවතට රැගෙන අධිකරණ වෛද්‍යවරයා වෙත යොමු කිරීමට රැගෙන ගිය බවත්, අධිකරණ වෛද්‍යවරයා වෙත ගොස් නැවත පැමිණෙන විට පොලිස් නිලධාරීන් සිතාමතාම අධිකරණය වෙත පැමිණීම පරක්කු කර සවස් වූ පසු තමන් දෙදෙනාව අධිකරණයට නැවත රැගෙන පැමිණි බවත් ප්‍රකාශ කර ඇත. ඒවන විට

අධිකරණ කටයුතු අවසන්වීමට ආසන්නව තිබූ බවත් අධිකරණය විසින් තමන් දෙදෙනාව බන්ධනාගාර ගත කළ බවත්, අධිකරණයට මෝසමක් ඉදිරිපත් කර 2024.12.05 වන දින තමා සහ පුත්‍රයා ඇප ලබාගත් බවත් පොලිස් නිලධාරීන්ගේ පහරදීමෙන් පුතාට අමාරු වූ බැවින් 2024.12.07 ජාතික රෝහලට ඔහුව ඇතුළත් කළ බවත්, එහිදී අධිකරණ වෛද්‍යවරයා විසින් පුතාව පරීක්ෂා කළ බවත්, මෙම අත්අඩංගුවට ගැනීම හා පහරදීම තුළින් තමාට හා පුත්‍රයාට සිදුවූ අසාධාරණයට සාධාරණයක් ඉෂ්ටකර දෙන මෙන් කොමිෂන් සභාවෙන් ඉල්ලීම් කර ඇත.

අගතියටපත් පාර්ශවයේ කරුණු දැක්වීම :

මෙම පැමිණිල්ලේ අගතියටපත් පාර්ශවය වන ගලගෙදර ආකාශ් විශ්ව තරණ සඳගල යන අය කොමිෂන් සභාව වෙත පහත පරිදි ප්‍රකාශයක් ලබාදී ඇත. තමා 2024.12.02 දින තමාගේ මිතුරෙකු වන විහඟ යන අයගේ මිතුරෙකුගේ උපන්දින සාදයකට සහභාගී වීම සඳහා එදින සවස 3.00ට පමණ තමාගේ පියාගේ බත්තරමුල්ලේ පිහිටි කාර්යාලයේ සිට පික්මී යතුරු පැදියකින් මට්ටක්කුලිය ඉන්ධන පිරවුම් හල අසලට පැමිණි බවත්, තමා එහි පැමිණෙන විට විහඟ සහ පසන් යන මිතුරන් දෙදෙනා ඉන්ධන පිරවුම්හල අසලට පැමිණ සිටි බවත්, මද වේලාවකින් එම ස්ථානයට සචින් යන මිතුරාද පැමිණි බවත්, විහඟ යන අයගේ තවත් මිතුරෙකු එම ස්ථානයට පැමිණෙන තෙක් සවස 4.30 පමණ වන තුරු ඉන්ධන පිරවුම්හල අසල තමා සිය යහලුවන් තිදෙනා සමග රැදී සිටි බවත් ප්‍රකාශ කර ඇත. එසේ රැදී සිටින විට තමා සමග මීට පෙර අවස්ථාවකදී ප්‍රශ්නයක් ඇති කරගෙන තිබූ සංජු යන අයට තමා ඉන්ධනහල අසල සිටින බව ආරංචිවී 4.30ට පමණ සංජු යන අය ඔහුගේ මව හා ඔහුගේ ඥාතියෙකු වන රේණුකා යන කාන්තාව සහ තවත් පිරිසක් සමඟ මට්ටක්තුලිය ඉන්ධන පිරවුම්හල අසලට පැමිණි බවත්, ඔවුන් පැමිණ ප්‍රශ්නයක් ඇති කරනු ඇතැයි තමාට සැක සිතුනු බැවින් තමා නැවත නිවසට යාමට සැරසෙන විට සංජු යන අයගේ මව තමාට කතා කොට පරුෂ වචනයෙන් බැන වැදුණු බවත්, මෙම පිරිස ඉන්ධන පිරවුම්හල අසලට පැමිණෙන විට පොලිස් ජීප් රථයක නිලධාරීන් දෙදෙනෙකු පැමිණ ඒ අසලම නතර කර තිබෙනු තමා දුටු බවත් පසුව එම නිලධාරීන් දෙදෙනා තමා ළඟට පැමිණ ප්‍රශ්නය කුමක්දැයි විමසා තමාව ජීප් රථයට නංවා ගැනීමට උත්සාහ කළ බවත් තමා රැගෙන යාමට හේතුව විමසුවද ඊට පිළිතුරු ලබානොදුන් බවත්, තමා ජීප් රථයට නැගීම ප්‍රතික්ෂේප කළ බැවින් එම නිලධාරීන් දෙදෙනා තමාට හොඳටම පහරදුන් බවත්, එම අවස්ථාවේ එක් නිලධාරියෙක් දුරකථනයෙන් කතා කර තවත් නිලධාරීන් පිරිසක් එම ස්ථානයට ගෙන්වා ගත් බවත්, ඉන්ධන පිරවුම්හල අසලට නිලධාරීන් 10 දෙනෙක් පමණ පැමිණි බවත්, එම අවස්ථාවේ රේණුකා නැමති කාන්තාව සෙනඟ අතරින් පැමිණ පත්තර කොළ වලින් ඔතන ලද යමක් පොලිස් නිලධාරීන්ට ලබාදී, “මේ ආයුධය ආකාශ් තමයි අරගෙන ආවේ” යැයි ප්‍රකාශ කළ බවත්, තමා එය කුමක්ද යන්න නොදුටු බවත්, මෙම සිදුවීම ආරම්භවන අවස්ථාවේදීම තමා සමග පැමිණි යහළුවන් එම ස්ථානයෙන් පිටව ගිය බවත්, තමාව ජීප් රථයට නංවා ගැනීමට උත්සාහ කරන අවස්ථාවේදී තමාගේ මව ද එම ස්ථානයට පැමිණි බවත් පොලිස් නිලධාරීන් තමාට පහර දෙන ආකාරය සිය මව ද දුටු බවත්, තමා පොලිස් ස්ථානයට රැගෙන යන විට සංජු යන අය හෝ ඔහු සමග පැමිණි පිරිස පොලිස් ස්ථානයට නොපැමිණි බවත්, තමා ජීප් රථයේ නංවාගෙන යන විට සිය පියාට දුරකථන ඇමතුමක් ලබාදී පොලිස්

නිලධාරීන් තමාට පහරදෙන බව ප්‍රකාශ කළ බවත් සඳහන් කර ඇත. තමාව පොලිස් ස්ථානයට රැගෙන ගිය පසු තමාව රැගෙන ගිය නිලධාරීන් සහ පොලිස් ස්ථානයේ සිටි නිලධාරීන් ද එකතුවී තමාට හොකී පිත්තකින් පහරදුන් බවත් පොලිස් ස්ථානයට ගිය පසු රේනුකා යන කාන්තාව විසින් ඉන්ධන පිරවුම්හල අසලදී පොලිස් නිලධාරීන්ට ලබාදුන් කොල වලින් ඔතා තිබූ යමක් එළියට ගත් බවත්, එය ආවරණය ඉවත් නොකළ අලුත්ම මන්නයක් බව තමා එවිට දුටු බවත්, තමාගේ අත ගෙන බලෙන්ම එම ආයුධය තමාට ඇල්ලීමට සැලැස්වීමට පොලිස් නිලධාරීන් උත්සාහ කළ බවත්, එහෙත් තමා එය නොඇල්ලූ බවත් ඊට පසු නැවත තමාට පහරදුන් බවත් ප්‍රකාශ කර ඇත. මද වේලාවකට පසු පියා පොලිස් ස්ථානයට පැමිණි බවත්, පොලිස් නිලධාරීන් තමාට පහරදුන් බව පියාට ප්‍රකාශ කළ බවත් එම අවස්ථාවේ පියා තමාගේ ඡායාරූපයක් ගැනීමට උත්සාහ කළ බවත්, එවිට එම ස්ථානයේ සිටි ඉනෝකා නිලධාරිනිය පියාගේ අතේ තිබූ ජංගම දුරකථනය උදුරාගත් බවත්, එම ස්ථානයේ රැස්ව සිටි පොලිස් නිලධාරීන් පියාව අල්ලාගෙන පියාට පහරදුන් බවත්, පියාට පහරදෙන අවස්ථාවේදී සිය මව ද එම ස්ථානයේ සිටි බවත්, පොලිස් නිලධාරීන් තමාට මෙන්ම පියාට සහ මවට පරුෂ වචනයෙන් බැන වැදුණු බවත්, පියාට පහරදී සිර මැදිරියට දැමූ බවත්, මද වේලාවකට පසු පියා නැවත එළියට ගත් බවත්, පියාව ස්ථානාධිපතිතුමාගේ කාමරයට කැඳවූ බවත් ඉන් පසු තමාව සහ පියාව සිර මැදිරිය ඉදිරියේ බංකුවක වාඩිකරවා තැබූ බවත් එදින රාත්‍රී 12.00 පමණ කැළුම් නැමති නිලධාරියා තමාගෙන් කටඋත්තරයක් ලබාගැනීමට ඇති බව පවසා තමාව පොලිස් ස්ථානයේ පිටුපස කාමරයකට රැගෙන ගොස් ඇඳුම් ගලවා පහරදුන් බවත්, කිසිදු කටඋත්තරයක් තමාගෙන් ලබානොගත් බවත්, කුමක් හෝ කොළයකට තමාගෙන් බලෙන් අත්සනක් ලබාගත් බවත් පසුව නැවත සිර මැදිරියට ගෙනවිත් දැමූ බවත්, ඊට පසු දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත රැගෙන ගොස් ඡායාරූප ලබාගෙන, අධිකරණය වෙත රැගෙන ආ බවත්, අධිකරණයට රැගෙනවිත් එහි තිබූ සිර මැදිරියට තමන් දෙදෙනා දැමූ බවත්, යළිත් ඉන් ඉවතට රැගෙන අධිකරණ වෛද්‍යවරයා වෙත යොමු කිරීමට රැගෙන ගිය බවත්, අධිකරණ වෛද්‍යවරයා වෙත ගොස් නැවත පැමිණෙන විට පොලිස් නිලධාරීන් සිතාමතාම අධිකරණය වෙත පැමිණීම පරක්කු කර සවස් වූ පසු තමන් දෙදෙනාව අධිකරණයට නැවත රැගෙන පැමිණි බවත්, ඒවන විට අධිකරණ කටයුතු අවසන්වීට ආසන්නව තිබූ බවත් අධිකරණය විසින් තමන් දෙදෙනාව බන්ධනාගාර ගත කළ බවත්, අධිකරණයට මෝසමක් ඉදිරිපත් කර 2024.12.05 වන දින තමාට සහ පියාට ඇප ලබාගත් බවත් පොලිස් නිලධාරීන්ගේ පහරදීමෙන් තමාට අසනීප වූ බැවින් 2024.12.07 ජාතික රෝහලට ඇතුළත් වී ප්‍රතිකාර ගත් බවත් ප්‍රකාශ කර ඇත.

ඇසින්දුටු සාක්ෂි :

අගතියටපත් පාර්ශවය වන ගලගෙදර ආකාශ් විශ්ව තරණ සඳගල යන අයගේ මව වන ජී.ඒ. විශාකා නිල්මිණි යන අය විසින් මෙම සිදුවීම සම්බන්ධයෙන් මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පහත ප්‍රකාශය ලබාදී ඇත. 2024.12.02 වන දින තමා නිවසේ රැදී සිටින විට තම සැමියාගේ අක්ක වන නෝනක්කා (දැනට ජීවතුන් අතර නොමැත) විසින් තමාට සවස 3.45 පමණ දුරකතන ඇමතුමක් ලබාදී, “මට රේණුකා කෝල් කරලා කිව්වා ආකාශ් ශෙඩ් එක ලගට ඇවිත් ඉන්නවා, අද නම් නිකං ඉන්නෙ නෑ කියලා” කියූ බවත්, ඒ අනුව තමා කඩිනමින් ඉන්ධන පිරවුම්හල අසලට ගිය බවත්,

ඉන්ධන පිරවුම්හල අසලට යන විට රේණුකා සහ තවත් පිරිසක් එම ස්ථානයේ රැස්ව සිටි බවත්, පොලිස් නිලධාරීන් දෙන්නෙක් ද සිවිල් ඇඳුමින් සිටි බවත්, තමා ඉන්ධන පිරවුම්හල අසලට වන විට තම පුතා හැර වෙනත් කිසිදු යහළුවෙක් ඒ අවස්ථාවේ එම ස්ථානයේ නොසිටි බවත් තමා යන විට පුතාට පහරදී තිබෙනු දුටු බවත්, පුතාට පහරදීමට හේතුව එම නිලධාරීන්ගෙන් විමසුව ද ඊට පිළිතුරු නොදී තමාට පරුෂ වචනයෙන් බැන වැදී තමාට ඒ ආසන්නයට ලංවීමට ඉඩ නොදී පුතාව ජීප් රථයට නංවාගැනීමට උත්සාහ කළ බවත්, එවිට තවත් නිලධාරීන් කිහිප දෙනෙකු එම ස්ථානයට පැමිණ පුතාව ජීප් රථයට නංවාගත් බවත්, ජීප් රථය තුළ දී නැවත පුතාට පහර දෙනු තමා දුටු බවත් පුතාට පහර නොදෙන ලෙසට ඉල්ලීම් කළ විට ඔවුන් නැවත තමාට පරුෂ වචනයෙන් බැන වැදුනු බවත් පුතාව ජීප් රථයට නංවාගෙන ගිය පසු රේණුකා සහ පිරිස එම ස්ථානයෙන් පිටව ගිය බවත්, පසුව තමා සිය සැමියාට දුරකථන ඇමතුමක් ලබාදී මෙම සිදුවීම පිළිබඳව දැනුවත් කළ බවත්, මට්ටක්කුලිය පොලිස් ස්ථානය ඉන්ධන පිරවුම්හලට ආසන්නයේම පිහිටා තිබූ බැවින් තමා ද ත්‍රීරෝද රථයක පොලිස් ස්ථානයට ගිය බවත්, පොලිස් ස්ථානයට රැගෙන ආ පසු ද පුතාට පහරදුන් බව පුතා තමාට ප්‍රකාශ කළ බවත් එම අවස්ථාවේ එම ස්ථානයේ සිටි ඉනෝකා නිලධාරිනිය තමාට “එළියට යනවාද? නැත්නම් මෙතන හිටියොත් ප්‍රශ්න වැඩි වේවි. තමුත්වත් ඇතුළට දාන්න වේවි” යනුවෙන් බැන වැදුණු බැවින් තමා එළියට පැමිණි බවත්, මද වේලාවකට පසු සිය සැමියා පැමිණි පසු, පොලිස් නිලධාරීන් පුතාට පහරදුන් බව තමා සැමියාට ප්‍රකාශ කළ බවත්, තමා ද සැමියා සමග පොලිස් ස්ථානය තුළට ගිය බවත් පොලිස් ස්ථානයට තුළට යන විට ඉනෝකා නිලධාරිනිය පුතාට කුමක් හෝ පවසමින් සිටිනු දුටු බවත් පුතා අසල පොලිස් නිලධාරීන් සියලුම දෙනා වටවී සිටිනු දුටු බවත්, සැමියා ගොස් සිදුවුනේ කුමක්ද යන්න පුතාගෙන් විමසූ පසු “තාත්තෙ මට මේ ඔක්කොම ගැහුවා” යැයි පැවසූ බවත්, එම අවස්ථාවේදී සැමියා විසින් පුතාගේ ඡායාරූපයක් ගැනීමට යාමේදී ඉනොක් නිලධාරිනිය සැමියාගෙ අතේ තිබූ දුරකථනය උදුරාගත් බවත්, අසල සිටි නිලධාරීන් සැමියා අල්ලාගත් බවත්, සැමියා ඇඳ සිටි ෂර්ට් එක නිලධාරියෙකු විසින් ඉරා දමා, සැමියාගේ උපැස් යුවළ බිම දමා කුඩු කර සැමියාට පහරදුන් බවත් සැමියාට පහරදීමට හේතුව විමසීමේදී තමාට පරුෂ වචනයෙන් බැන වැදී තමාව එළවා දැමූ බවත්, සැමියා සිරමැදිරියට දැමූ බවත් තමාට සැමියාව හෝ පුතාව නැවත බැලීමට අවස්ථාවක් ලබානොදුන් බවත් එදින රාත්‍රී 10.00 පමණ තමා නීතිඥවරයෙකු සමග පොලිස් ස්ථානයට පැමිණි පසු සැමියා සහ පුතා බැලීමට අවස්ථාව ලබාදුන් බවත්, පුතා සිර මැදිරිය තුළත් සැමියා ඒ අසල බංකුවක වාඩිකරවා සිටි බවත් නීතිඥ මහතා ගොස් ස්ථානාධිපතිතුමා හමුවූ බවත්, පසු දින අධිකරණයට යොමුකරන බව ප්‍රකාශ කළ බැවින් නිවසට ගොස් ඊට පසු දින පොලිස් ස්ථානයට පැමිණ සැමියා සහ පුතා සමග කතා කොට අධිකරණ පරිශ්‍රයටවී සිටි බවත් එදින දවල් 11.30 පමණ ඔවුන් දෙදෙනාව රැගෙන විත් අධිකරණයේ තිබූ සිරමැදිරියට දමා නැවත රැගෙන ගොස් තිබූ බවත් එසේ රැගෙන ගිය බව තමා හෝ නීතිඥ මහතා දැනුවත් නොවූ බවත්, එම ස්ථානයේ සිටි පොලිස් නිලධාරියෙක් ගෙන් තමා ඒ පිළිබඳ විමසූ පසු අධිකරණ වෛද්‍ය නිලධාරියා වෙත යොමුකරවීම සඳහා ඔවුන් රැගෙන ගිය බව දැනුම්දුන් බවත්, ඔවුන් නැවත රැගෙන පැමිණියේ අධිකරණ කටයුතු අවසාන වීමට ආසන්න අවස්ථාවේදී බවත්, අධිකරණ නියෝග මත ඔවුන් බන්ධනාගාර ගත කළ බවත් ප්‍රකාශ කර ඇත.

වගඋත්තර පාර්ශවයේ කරුණු දැක්වීම :

පළමුවන වගඋත්තරකරු : ප්‍ර. පො. ප. ආර්. ඒ. ආර්. ඩී. කරුණාරත්න මයා (හිටපු ස්ථානාධිපති, මට්ටක්කුලිය පොලිස් ස්ථානය)

2025.08.21 වන දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේදී පවත්වන ලද පරීක්ෂණය සඳහා සහභාගී වෙමින් පහත සඳහන් ප්‍රකාශය ලබාදී ඇත.

2024.12.02 වන දින මට්ටක්කුලිය ඉන්ධනහල අසල අන්තරාදායක ආයුධයක් සමග පුද්ගලයෙකු ඉන්ධනහල අසල රැදී සිටින බවට සහ පහරදීමක් සඳහා පුද්ගලයින් කිහිපදෙනෙකු ඉන්ධනහල අසල රැදී සිටින බවට, එදින ජංගම සංචාරයේ යෙදී සිටි පො. සැ. 53137 වී. එම්. ආනන්ද ගුණසේකර නිලධාරියාට සහ පො. කො. රි. 80765 එම්. එච්. ජේ. සකලසූරිය යන නිලධාරින් දෙනොට පැය 17.00 ට පමණ ලද තොරතුරකට අනුව, එම ස්ථානයට ගිය මෙම නිලධාරින් දෙදෙනා විසින් ජී. ඒ. විශ්ව තරණ සඳගල යන අය අන්තරාදායක ආයුධයක් සමග වරද කියාදී අත්අඩංගුවට ගෙන ඇති බවත්, එම සැකකරු ත්‍රිරෝද රථයකින් තවත් ළමුන් කිහිපදෙනෙකු සමග පැමිණ ඇති අතර එම ළමුන් මෙම ආයුධය සම්බන්ධයෙන් කිසිවක් දැන නොසිටිම හේතුවෙන් එම ළමුන් අත්අඩංගුවට ගැනිම සිදු කර නොමැති බවත් සඳහන් කර ඇත. ඉහත නිලධාරින් දෙදෙනා මෙම සිදුවීම සම්බන්ධයෙන් තමා දැනුවත් කළ බවත්, පොලිස් ස්ථානයට සැකකරු රැගෙන ආ පසු සැකකරුගේ පියා වන ජී.එන්.එන්.සඳගල යන අය පැමිණ සිය පුත්‍රයා අත්අඩංගුවට ගැනිම සම්බන්ධයෙන් කලහාකාරි ලෙස චෝදනාගාරය තුළ හැසිරී ඇති බවත්, එදින තමා මාර්ගගත ක්‍රමයට සාකච්ඡාවකට සම්බන්ධවී සිටි බැවින් මෙම සිදුවීම සම්බන්ධයෙන් එදින උපසේවයේ සිටි පො.කො. 24052 රාජපක්ෂ නිලධාරියා විසින් තමාව දැනුවත් කල බවත් ප්‍රකාශ කර ඇත. එම අවස්ථාවේදී මෙම පුද්ගලයා විසින් උපසේවක නිලධාරියාව තල්ලු කර ඇති අතර චෝදනාගාරය වීඩියෝ ගත කිරිමට උත්සහ කර ඇති අතර, එම පුද්ගලයා මානව හිමිකම් ආයතනයේ නිලධාරියෙකු බවට ප්‍රකාශ කරමින් මෙසේ කලහාකාරි ලෙස හැසිරී ඇති බවත් සඳහන් කර ඇත. උපසේවක නිලධාරියා විසින් මෙම සිදුවීම පිළිබඳව තමා දැනුවත් කළ පසු ජී.එන්.එන්. සඳගල යන අයව තමාගේ රාජකාරි කාමරයට කැඳවා විමසිමක් සිදු කළ බවත්, එම අවස්ථාවේදි සිය පුත්‍රයා අත්අඩංගුවට ගැනිමට හේතු විමසා සිටි අතර ඔහු සන්තකයේ අන්තරාදායක ආයුධයක් වන කඩුවක් තබා ගෙන සිටිම හේතුවෙන් අත්අඩංගුවට ගැනිම සිදු කර ඇති බවට තමා විසින් ජී.එන්.එන්. සඳගල යන අයට පැහැදිලි කළ බවත්, ජී.එන්.එන්. සඳගල යන අය මානව හිමිකම් ආයතනයේ වැඩ කරන බව තමාට ද ප්‍රකාශ කළ බවත්, තමා විසින් එම ආයතනයේ හැඳුනුම්පතක් තිබේනම් ලබා දෙන ලෙස ප්‍රකාශ කළමුත් හැඳුනුම්පතක් තමා වෙත ලබානොදුන් බවත් සඳහන් කර ඇත. අනතුරුව තමා උපසේවක වෙත මෙම පුද්ගලයා ප්‍රකාශ කරන දේ පිළිබඳව සොයාබලා සටහන් යොදන ලෙස දැනුම්දුන් බවත්, පසුව 'සාපරාධී බලහත්කාරය පාමින් රාජ්‍ය ආයතනයකට පැමිණ රාජකාරියේ නියුතු නිලධාරින්ට අඩත්තෙට්ටම් සිදු කිරිම සම්බන්ධයෙන්' වරදකියාදී එම පුද්ගලයාව අත්අඩංගුවට ගන්නා ලෙස තමා විසින් එදින කාර්ය භාර රාජකාරියේ යෙදී සිටි පො.සැ. 74791 විජේසිංහ නිලධාරියාට උපදෙස් ලබාදුන් බවත් ප්‍රකාශ කර ඇත. ඒ අනුව කාර්යය භාර නිලධාරියා විසින් ජී.එන්.එන්. සඳගල යන අයට වරද කියාදී අත්අඩංගුවට ගෙන ලේඛන වලට

ඇතුළත් කිරීම සිදු කර ඇති බවත්, ඊට පසුදින ජාතික රෝහලේ අධිකරණ වෛද්‍යවරයා වෙත මෙම සැකකරුවන් දෙදෙනාම යොමු කිරීමෙන් පසුව අධිකරණයට ඉදිරිපත් කිරීම සිදු කළ බවත් වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත.

දෙවන වගඋත්තරකරු : පො. සැ. 53137 වී. එම්. ආනන්ද ගුණසේකර මයා

2025.08.21 වන දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේදී පවත්වන ලද පරීක්ෂණය සඳහා සහභාගී වෙමින් පහත සඳහන් ප්‍රකාශය ලබාදී ඇත.

2024.12.02 දින තමා, රියදුරු පො. කො. රි. 80765 එම්. එච්. ජේ. සකලසූරිය නිලධාරියා විසින් පදවන ලද LF-3974 දරණ ජීප් රථයෙන් පොලිස් ස්ථානයේ සිටි සැකකරුවන් මාලිගාකන්ද අධිකරණයට භාරදී මට්ටක්කුලය පොලිස් වසම ආවරණය වන පරිදි දිවා ජංගම සංචාර රාජකාරියේ යෙදුණු බවත්, එදින දිවා ජංගම සංචාරය අතරතුරදී ශ්‍රී වික්‍රම මාවතේ ඉන්ධනහල අසලට පිරිසක් පහරදීමකට පැමිණ සිටින බවට පොලිස් ස්ථානයේ එදින උපසේවක රාජකාරියේ යෙදී සිටි නිලධාරියා විසින් දුරකථන ඇමතුමක් තමාට ලබාදුන් බවත්, ඒ අනුව ශ්‍රී වික්‍රමපුර ඉන්ධනහල අසලට යන විට වයස අවුරුදු 17, 19 වගේ වයස්වන පිරිමි ළමුන් 6 ක් පමණ රැඳී සිටිනු දුටු බවත් ප්‍රකාශ කර ඇත. එහි සිටි එක් අයෙක් අත කලුපාට බෑග් එකක් සැක කටයුතු ලෙස තිබෙණු දුටු බවත්, තමා පො. කො. රි. 80765 එම්. එච්. ජේ. සකලසූරිය නිලදාරියාට එම බෑගය පරික්ෂා කරන ලෙසට උපදෙස් ලබාදුන් බවත්, එම පිරිස පැමිණ සිටියේ වාහනයක නොවන බවත් එම පිරිස පයින් පැමිණ සිටි බවත්, එම ස්ථානයේ රැස්ව සිටි ළමුන්ගෙන් දෙදෙනෙක් පසෙකටවී සිටි බවත්, පො. කො. රි. 80765 එම්. එච්. ජේ. සකලසූරිය නිලධාරියා බෑගය පරික්ෂා කිරීමට උත්සාහ කරන විට බෑගය අතේ තබාගෙන සිටි ළමයා ඊට ඉඩ නොදී එම නිලධාරියා සමග බහින්බස් වූ බවත්, එම අවස්ථාවේදී එම සැකකරු පො.කො.රි. 80765 එම්.එච්.ජේ. සකලසූරිය නිලධාරියාගේ නිල ඇඳුමේ කොලරයෙන් අල්ලා පිටුපසට තල්ලු කළ බවත්, එම අවස්ථාවේදී එම ළමයා සහ නිලධාරියා අතර පොරබැදීමක් සිදු වූ බවත්, පොර බැදීමේදී දෙදෙනාම බිම වැටුණු බවත්, තමන් ද ඔවුන් සමීපයට කඩිනමින් ගිය බවත්, ඉන්ධනහල තුළ සිටි පිරිසත් පැමිණ පොර බැදීම නතර කිරීමට උත්සහ කළ බවත්, එහෙත් එය අසාර්ථක වූ බවත්, තමන් විසින් සැකකරුවන ආකාශ් විශ්ව තරණ යන අයගේ අතේ තිබූ බෑගය උදුරාගත් බවත්, එය පරික්ෂා කිරීමේදී දිග අලුත් සුදු පැහැති කඩුවක් දැක ගැනීමට හැකි වූ බවත්, එම අවස්ථාවේදී පොලිස් ස්ථානයෙන් තවත් නිලධාරීන් තිදෙනෙක් පමණ එම ස්ථානයට පැමිණි බවත් ප්‍රකාශ කර ඇත. ඉන්ධනහල පිහිටා ඇත්තේ පොලිස් ස්ථානයට ජේනදුරින් වන බැවින් ඉන්ධනහල අසල සිදුවුන කලහාකාරී ගැටුම පිළිබඳව පොලිස් ස්ථානයට දැනගැනීමට ලැබී එම නිලධාරීන් ඉන්ධනහල අසලට පැමිණෙන්නට ඇති බවත්, තමන් මට්ටක්කුලිය පොලිස් ස්ථානයට ස්ථාන මාරු ලබා පැමිණ සති 2ක් වැනි කෙටි කාලයක් වන බැවින් එම අවස්ථාවේ පැමිණි නිලධාරීන් කව්ද යන්න තමාට මතක නොමැති බවත්, පසුව පැමිණි නිලදාරීන්ගේ ද උදව් ඇතිව ආකාශ් විශ්ව තරණ යන අයව ජීප් රථයට නංවාගත් බවත්, පැමිණිල්ලේ සඳහන් පරිදි මෙම සැකකරුට කිසිදු පහර දීමක් සිදු නොකළ බවත්, අත්අඩංගුවට ගන්නා අවස්ථාවේදී පො.කො.රි. 80765 එම්.එච්.ජේ. සකලසූරිය නිලධාරියා සමග පොර බැදීම නිසා දෙදෙනාව බිම වැටුණු බවත් ප්‍රකාශ කර ඇත. පසුව පොලිස්

ස්ථානයට පැමිණ උපසේවක නිලධාරියාට සැකකරුව භාරදී තමා අපරාධ අංශයට ගොස් මෙම අත්අඩංගුවට ගැනිම සම්බන්ධයෙන් සටහන් ඇතුලත් කිරිම සිදු කළ බවත් ප්‍රකාශ කර ඇත. එම කාලය අතරතුර මෙම සැකකරුගේ පියා පැමිණ චෝදනාගාරය තුළ කලහාකාරි ලෙස හැසිරී ඇති බවත්, තමා එම අවස්ථාවේදි එම ස්ථානයේ නොසිටි බවත්, එම සිදුවිම පිළිබඳ තමා කිසිවක් නොදන්නා බවත් තමා සිදු කලේ සැකකරුවන ආකාශ් විශ්ව තරණ යන අය අත්අඩංගුවට ගෙන ස්ථානයට ඉදිරිපත් කිරිම පමණක් බවත් තමා හෝ තමාගේ නිලධාරින් විසින් කිසිදු පහර දිමක් සිදු නොකළ බවත්, තමාගේ සටහන් වල පො.කො.රි. 80765 එම්.එච්.ජේ. සකලසූරිය නිලධාරියා සමග සිදු වූ පොරබැදිම සහ සැකකරු බිම වැටිමෙන් කොන්ද ප්‍රදේශය තැලීම් සිරීම් දැක ගත හැකි වූ බවට සටහන් යෙදුවූ බවත් ප්‍රකාශ කර ඇත.

තුන්වන වගඋත්තරකරු - පො. කො. රි. 80765 එම්. එච්. ජේ. සකලසූරිය මයා

2025.08.21 වන දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේදී පවත්වන ලද පරීක්ෂණය සඳහා සහභාගී වෙමින් පහත සඳහන් ප්‍රකාශය ලබාදී ඇත.

2024.12.02 දින තමා පොලිස් ජීප් රථයෙන් පො.සැ. 53137 වී.එම්. ආනන්ද ගුණසේකර නිලධාරියා සමග දිවා ජංගම සංචාරයේ රාජකාරි කටයුතු කරමින් සිටි බවත්, තේ පානය කිරිමට සහ දිවා ආහාරය ලබාගැනීමට සංචාරය අතරතුර වරින්වර පොලිස් ස්ථානයට පැමිණි බවත් එසේ පැමිණි අවස්ථාවක ඉන්ධනහල අසල කඩුවලින් පහර දිමට පිරිසක් පැමිණ සිටින බවට පොලිස් ස්ථානයට දුරකථන ඇමතුමක් ලැබී තිබූ බවත්, ඒ අනුව පො.සැ. 53137 වී.එම්. ආනන්ද ගුණසේකර නිලධාරියා විසින් ඉහත තොරතුර පිළිබඳව තමාව දැනුවත් කරමින්, ඉන්ධන හල අසලට එය බැලීම සඳහා යායුතු බව දැනුම්දුන් බවත් ප්‍රකාශ කර ඇත. තමන් දෙදෙනා ඉන්ධනහල අසලට යන විට ඉන්ධනහල අසල පිහිටි ත්‍රිරෝද රථ නැවතුම් පොල ආසන්නයේ පිරිමි ළමුන් 6 දෙනෙකු පමණ රැස්වී සිටිනු දුටු බවත්, පො.සැ. 53137 වී.එම්. ආනන්ද ගුණසේකර නිලධාරියා එම ස්ථානයේ වාහනයෙන් බැස ගත් බවත්, තමා වාහනය නතර කිරිම සඳහා ඉන්ධනහල අසලට ගිය බවත් ප්‍රකාශ කර ඇත. එම ළමුන් රැස්ව සිටි ස්ථානයේ සිට ඉන්ධනහල ලගට මීටර් 3 ක් පමණ දුරක් තිබූ බවත්, තමන් වාහනය නතර කර එම ස්ථානයට ගිය පසු, එතැන සිටි එක් පිරිමි ළමයෙක් අතේ කලු පාට බෑග් එකක් තිබෙණු දුටු බවත් තමන් දෙදෙනා විසින් එම බෑගය පරික්ෂා කිරිමට යාමේදී එතැන සිටි ළමුන් විසිර ගිය බවත්, බෑගය අතේ තිබුණු ළමයා පමණක් රැදි සිටි බවත් ඔහු තැති ගැන්මෙන් සිටිනු දුටු බවත්, බෑගය ඉල්ලා සිටියත් එය ලබා දිම ප්‍රතික්ෂේප කළ බවත්, ඔහු ආසන්නයේ සිටි ළමුන් දෙදෙනෙක් තමා අසලින් යන විට "කරවල කුරියෙක් විදිහට කඩුවක් තමයි ඔය තියාගෙන ඉන්නේ" යනුවෙන් කියමින් ගිය බවත්, එය ඇසුණු පසු තමන් බෑගය ලබා ගැනිමට උත්සහ කළ නමුත්, එය නොදුන් නිසා එය තියාගෙන හිටපු ආකාශ් විශ්ව තරණ යන අය සමග බෑගය ලබා ගැනිමට පොර බැදූ බවත්, බෑගය මතුපිටින් අල්ලා බලනවිට එය තුළ යකඩයක් වැනි දෙයක් තිබෙන බව තමාට තේරුම් ගිය බවත්, සැකකරු සමග දිගින් දිගටම පොර බැදූ බවත්, පොරබැදීමේදී බිම වැටී පොර බැදිමක් සිදු නොවූ බවත් ප්‍රකාශ කර ඇත. ඒ වේලාවේදි පොලිස් ස්ථානයේ සිටි නිලධාරින් තිදෙනෙක් පමණ එම ස්ථානයට පැමිණි බවත් ඉන්ධනහල අසල සිටි පිරිසත් එම ස්ථානයට එකතු වූ බවත්, පැමිණි නිලධාරින් සහ අවට සිටි

පිරිසගේ උදව්වෙන් සැකකරු ජීප් රථයට නංවාගත් බවත් ප්‍රකාශ කර ඇත. තමන් එම ස්ථානයේදී බෑගය විවෘත කර නොබැලූ බවත්, බෑගය පිටතින් අල්ලා බැලූ පසු එහි කඩුවක් ඇති බවට හැඟී ගිය බවත්, පොලිස් ස්ථානයට පැමිණි පසු බෑගය විවෘත කර බැලූ විට එහි අලුත් කඩුවක් තිබූ බවත් ප්‍රකාශ කර ඇත. වාහනය පොලිස් ස්ථානය තුළ නතර කර තැබීමට ඉඩ පහසුකම් නොමැති බැවින් සැකකරු සහ නඩු භාණ්ඩ හා අනෙක් නිලධාරීන් පොලිස් ස්ථානයේ ගේට්ටුව අසලින් බස්සවා වාහනය නතර කර තැබීම සඳහා පන්සල අසලට ගිය බවත්, රථය නතර කොට නැවත පොලිස් ස්ථානයට පැමිණි බවත්, ස්ථානාධිපතිතුමා තමාට කතා කොට මෙම සිදුවීම පිළිබඳව විමසා සිටි බවත් තමා ඒ පිළිබඳව ස්ථානාධිපතිතුමන්ව දැනුවත් කළ බවත්, තමන් නැවතත් මෙම සිදුවීම් කිසිවකට සම්බන්ධ නොවූ බවත්, පැමිණිල්ලේ සඳහන් පරිදි කිසිදු පහරදීමක් තමන් සිදු නොකළ බවත්, ආයුධය ලබා ගැනීම සඳහා පොර බැදීමක් පමණක් තමන් සිදු කළ බවත්, ඒ අවස්ථාවේ බිමට වැටුණට බිම පෙරලමින් පොර බැදීමක් සිදු නොකළ බවත්, පොරබැදීමේදී තැලීම් සිරීම් සිදුවෙන්න ඇති බවත්, තමාට ද පොඩි සිරීම් තැලීම් තිබූ බවත් බෙහෙත් ගැනීමට තරම් බරපතල තත්වයක් නොතිබූ බවත් ප්‍රකාශ කර ඇත.

හතරවන වගඋත්තරකරු : පො. සැ. 12104 ආර්. එස්. කේ. ඒ. ප්‍රියන්ත මයා

2025.03.05 වන දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේදී පවත්වන ලද පරීක්ෂණය සඳහා සහභාගී වෙමින් පහත සඳහන් ප්‍රකාශය ලබාදී ඇත.

තමා මාට්ටක්කුලිය පොලිස් ස්ථානයේ අපරාධ අංශයේ උසාවි භාර නිලධාරියා වශයෙන් රාජකාරී කටයුතු කරනු ලබන බවත්, 2024.12.02 වන දින තමා පොලිස් ස්ථානයට උදෑසන 7.00 ට පමණ රාජකාරියට වාර්තා කර රාත්‍රී පැය 20.00 පසුවී විවේකය වාර්තා කළ බවත් ප්‍රකාශ කර ඇත. මෙම සිදුවීම සිදුවන අවස්ථාවේදී තමා පෞද්ගලික කටයුත්තක් සඳහා මට්ටක්කුලිය බල ප්‍රදේශයෙන් පිටතට ගොස් සිටි බවත්, නැවත පැමිණෙන අවස්ථාවේදී මෙම පැමිණිලිකරු සහ ඔහුගේ පුත්‍රයා චෝදනා ගාරයේ පුටුවේ වාඩිවී සිටිනවා තමා දුටු බවත් ප්‍රකාශ කර ඇත. පසුව තමා අපරාධ අංශට ගොස් ලේඛන කටයුතුවල නිරත වෙමින් සිටි බවත් මෙම සැකකරුවන් අත්අඩංගුවට ගැනීම හෝ ප්‍රශ්න කිරීම සම්බන්ධයෙන් තමාගේ සම්බන්ධයක් නොමැති බවත්, මෙම සැකකරුවන් දෙදෙනා 2024.12.03 වන දිනට අධිකරණයට ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය බී වාර්තා සකස් කර රාත්‍රී විවේකය වාර්තා කර නිවසට පිටව ගිය බව සඳහන් කර ඇත. ජී. ඒ. විශ්ව තරණ සඳගල යන අය අන්තරාදායක ආයුධයක් වන කඩුවක් ලග තබා ගැනීමේ වරදට හා සංවිධානාත්මකව එම ප්‍රදේශයට පැමිණ පුද්ගයන් පිරිසකට මරණ තර්ජන කිරීමේ වරදට අධිකරණයට කරුණු වාර්තා කිරීමෙන් අනතුරුව සංවිධානාත්මකව සිදුකරනු ලැබූ අපරාධයක් නිසා විමර්ශනය අවසන් කර ප්‍රගතිය වාර්තා කරන තෙක් රක්ෂිත බන්ධනාගාර ගත කරන ලෙස බී වාර්තාව මගින් ඉල්ලා සිටි බවත්, ඒ අනුව අලුත්කඩේ අංක 06 අධිකරණයේ මහෙස්ත්‍රාත්තුමා විසින් එම අය රක්ෂිත බන්ධනාගාර ගත කරන ලෙස නියෝග නිකුත් කළ බවත් සඳහන් කර ඇත. එසේම ජී.එන්.එන්. සඳගල යන අය සම්බන්ධයෙන් ද රාජ්‍ය ආයතනයක් තුළ රාජකාරියට බාධා කිරීම අඩම්තෙට්ටම් කිරීම යන කරුණු යටතේ ගරු අධිකරණයට කරුණු වාර්තා කළ බවත්, ගරු මහෙස්ත්‍රාත්තුමන් විසින් ජී.එන්.එන්. සඳගල යන ද රක්ෂිත බන්ධනාගාර ගත කිරීමට නියෝග ලබාදුන් බව ප්‍රකාශ කර ඇත.

පස්වන වගඋත්තරකරු : කා. පො. සැ. 3429 ටී. එම්. ඉනෝකා සුභාරිස් මිය

2025.03.05 වන දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේදී පවත්වන ලද පරීක්ෂණය සඳහා සහභාගී වෙමින් පහත සඳහන් ප්‍රකාශය ලබාදී ඇත.

2024.12.02 වන දින තමා සුපුරුදු පරිදි රාජකාරියට වාර්තා කර තමාගේ කාර්යාලයේ රාජකාරි කිරිමෙන් අනතුරුව විවේකය වාර්තා කිරිමට චෝදනාගාරයට යන අන අවස්ථාවේදි කඩුවක් සමග අත්අඩංගුවට ගත් ජී. ඒ. විශ්ව තරණ සඳගල යන දරුවා චෝදනාගාරය තුළ තිබෙන යකඩ බංකුවේ වාඩි කරවා සිටිනු දුටු බවත්, ඒ අවස්ථාවේ ඒ අසල එම දරුවාගේ මව සහ තවත් කීප දෙනෙක් දරුවා සමග කතා කරමින් සිටිනු දුටු බවත් තමා විවේකය වාර්තා කර නැවත තමාගේ කාර්යාලයට ගොස් පැමිණෙන අවස්ථාවේදී ජී. ඒ. විශ්ව තරණ සඳගල යන අයගේ පියා වන ජී.එන්.එන්. සඳගල යන අය ඔහුගේ ජංගම දුරකථනයෙන් චෝදනාගාරය වීඩියෝ ගත කරනවා තමා දුටු බවත්, එවිට තමා ජී.එන්.එන්. සඳගල යන අයට පොලිස් ස්ථානය තුළ වීඩියෝ කිරීම නොකරන ලෙස දැනුම්දුන් බවත්, එවිට එම තැනැත්තා "මගේ පුතාව මම වීඩියෝ කරන්නේ" යනුවෙන් ප්‍රකාශ කළ බවත් සඳහන් කර ඇත. එහෙත් තමා නැවත වරක් පොලිස් ස්ථානය තුළ වීඩියෝ නොකරන ලෙස දැනුම්දුන් නමුත් එම තැනැත්තා තමා කී දේවල් ගණනකට නොගෙන ඔහුගේ පුතා වාඩිකර සිටි බංකුව හා ඒ අවට ප්‍රදේශය වීඩියෝ ගත කරන අවස්ථාවේදි තමා විසින් ඔහු අල්ලා සිටි ජංගම දුරකථනයේ කැමරාව වැහෙන ආකාරයට තමාගේ අත්ල තැබූ බවත්, තමා එසේ සිදුකරනු ලැබුවේ පොලිස් ස්ථානයේ අවි ගබඩාව හා සිර මැදිරිය ඒ ආසන්නයේ පිහිටා තිබූ බැවින් බවත්, මෙම සිදුවීම වන අවස්ථාවේදී එම ස්ථානයේ රැදී සිටි උපසේවක නිලධාරියා සහ පො.සැ. 74719 ඩබ්.එම්.ආර්.එල්. විජේසිංහ නිලධාරියා එම ස්ථානයට පැමිණ මෙම ජී.එන්.එන්. සඳගල යන අය දුරකථනයෙන් වීඩියෝ ගත කරන ක්‍රියාව නතරකර දැමිමට කටයුතු කළ බවත්, එම අවස්ථාවේ එම පුද්ගලයා ඉතා ආවේගශීලීව හැසිරුණු බවත්, මෙම සිදුවිම සිදුවන අවස්ථාවේදි ස්ථානාධිපතිතුමා මාර්ග ගත ක්‍රමය ඔස්සේ රැස්විමක නිරතව සිටි බැවින් එයට බාධා ඇතිවන නිසා ස්ථානාධිපතිතුමා විසින් උපසේවක නිලධාරියා කැඳවා ශබ්ද කිරීම නතර කරන ලෙසට උපදෙස් ලබාදුන් බවත් ප්‍රකාශ කර ඇත. පසුව ජී.එන්.එන්. සඳගල යන අය පාලනය කර ගැනීමට නොහැකි වූ බැවින් ස්ථානාධිපතිතුමාගේ නියෝග පරිදි අත්අඩංගුවටගෙන සිර මැදිරියට දැමූ බවත්, පසුව තමා මෙම සිදුවිම සම්බන්ධව සටහන් යොදා විවේකය වාර්තා කර පිටත්ව ගිය බවත් සඳහන් කර ඇත.

හයවන වගඋත්තරකරු : පො. කො. 24052 ආර්. ආර්. රාජපක්ෂ මයා

2025.07.30 වන දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේදී පවත්වන ලද පරීක්ෂණය සඳහා සහභාගී වෙමින් පහත සඳහන් ප්‍රකාශය ලබාදී ඇත.

2024.12.02 දින තමා පොලිස් ස්ථානයේ උපසේවා රාජකාරිවල යෙදි සිටි බවත්, එදින ජංගම සංචාරයේ යෙදි සිටි පො. සැ. 53137 වී.එම්. ආනන්ද ගුණසේකර නිලධාරියා විසින් අත්අඩංගුවට ගන්නා ලද ජී. ඒ. විශ්ව තරණ සඳගල යන සැකකරු චෝදනාගාරයේ සිරමැදිරිය ඉදිරිපිට තබා ඇති බංකුවෙහි වාඩි කරවා පො. සැ. 53137 වී. එම්. ආනන්ද ගුණසේකර නිලධාරියා විසින් ප්‍රශ්න කරනු

ලැබු බව සඳහන් කර ඇත. තමා උපසේවා ස්ථානය වෙත පැමිණෙන විට ඉහත සැකකරුගේ පියා යැයි කියන ජී.එන්.එන්. සඳගල යන අය විසින් බංකුවේ වාඩිවී සිටි සැකකරු ඡායාරූප ගත කිරිමට උත්සහ කරන අවස්ථාවේ කා.පො.සැ. 3429 ඉනෝකා නිලධාරිනිය පැමිණ ඔහු අතේ තිබු දුරකථනය ලබාගත් බවත්, එම නිලධාරිනිය විසින් ස්ථානය ඇතුළත ඡායාරූප ගන්නේ කොහොමද කියලා එම පුද්ගලයාගෙන් විමසා සිටි බවත්, එවිට එම පුද්ගලයා තමා මානව හිමිකම් ආයතනයේ යැයි ප්‍රකාශ කරමින් තමාගේ පුතාට පොලිසියෙන් පහර දී ඇති බවත්, හොඳ වැඩක් කරන්නම් කියලා කෑගැසූ බවත් ප්‍රකාශ කර ඇත. එවිට තමා විසින් ඔහුට මෙතැන කෑ ගහන්න එපා යැයි ප්‍රකාශ කළ බවත් එවිට ඔහු විසින් තමාව තල්ලු කළ බවත්, එම අවස්ථාවේ ස්ථානාධිපති ප්‍ර.පො.ප. රෝහණ කරුණාරත්න මහතා මාර්ග ගත රැස්වීමක සිටි බැවින් ස්ථානාධිපතිතුමා තමාව රාජකාරී කාමරයට කැඳවා චෝදනාගාරයේ ශබ්දය වැඩි බවත් ඊට හේතුව විමසා සිටි බවත්, එවිට තමා විසින් ස්ථානාධිපතිතුමාහට මානව හිමිකම් ආයතනයේ යැයි පවසන පුද්ගලයෙක් පැමිණ සිටින බව දැනුම්දුන් පසු, ස්ථානාධිපතිතුමා විසින් එම අයගේ අනන්‍යතාවය තහවුරු කර ගැනීම සඳහා හැඳුනුම්පත පරික්ෂා කරන ලෙස තමාට ප්‍රකාශ කළ බවත්, ඒ අනුව තමා එම පුද්ගලයාගෙන් හැඳුනුම්පත ඉල්ලා සිටි අවස්ථාවේ ඔහු විසින් නිල් පාටට හුරු හැඳුනුම්පතක් වැනි යමක් ගෙන අතේ තබාගෙන එය දෙපැත්තට සොලවා අනන්‍යතාවය තහවුරු කරන්න තමා බැදි නැති බව ප්‍රකාශ කරමින් එය නැවතත් හැඳුනුම්පත් රඳවනය තුළට දමාගත් බවත් ප්‍රකාශ කර ඇත. පසුව, එදින පොලිස් ස්ථානයේ කාර්යභාර නිලධාරියා ලෙස රාජකාරී කළ පො.සැ. 74719 ඩබ්.එම්.ආර්.එල්. විජේසිංහ නිලධාරියා එම ස්ථානයට පැමිණ 'රාජ්‍ය නිලධාරින්ට අඩත්තේට්ටම් කිරිම හා සාපරාධි බලහත්කාරයපෑම' යන වරද කියාදී සැකකාර ජී.එන්.එන්. සඳගල යන පුද්ගලයා අත්අඩංගුවට ගත් බවත්, ඉන්පසු එම නිලධාරියා විසින ජී.එන්.එන්. සඳගල යන අය උපසේවයට භාරදුන් බවත්, එම සැකකරුගේ බාහිරින් පෙනිමට තුවාල කිසිවක් නොතිබූ බැවින් සටහන් යොදා පැය 17.45 ට භාර ගනු ලැබු බවත් ප්‍රකාශ කර ඇත. පසුව විශ්ව තරණ යන අය ද පැය 18.15 ට උපසේවය වෙත භාර දුන් බවත්, ඔහුව පරික්ෂා කිරීමේදී, ඔහුගේ පිටෙහි උඩ කොටසේ තැලිම් තුවාල සහ සිරීම් තුවාල ද, දකුණු අතෙහි වැලමිටට උඩින් තැලීම් තුවාලයක් ද තිබූ බැවින් එය සටහන් කළ බව ප්‍රකාශ කර ඇත. විශ්ව තරණ යන අය උපසේවයට භාරගන්නා අවස්ථාවේදී එම සැකකරුට පොලිස් නිලධාරීන් විසින් පහර දුන් බව ඔහු තමාට කියා සිටි බවත්, එහෙත් උපසේවා රාජකාරියේ යෙදී සිටින නිලධාරියා විසින් සටහන් කර ගනු ලබන්නේ උපසේවයට භාර දෙන අවස්ථාවේදි සැකකරුගේ බාහිරින් පෙනීමට ඇති තුවාල සම්බන්ධයෙන් පමණක් වන බැවින් සැකකරු ප්‍රකාශ කළ බාහිර කරුණු සටහන් නොකළ බවත්, එයට හේතුව සැකකරු ලබාදෙන අනෙකුත් ප්‍රකාශ අත්අඩංගුවට ගත් නිලධාරියා ඇතුලු පිරිස විසින් ප්‍රකාශ ලබාගැනීමේදී සටහන් කරගනු ලබන බැවින් බවත් සඳහන් කර ඇත. එහෙත් තමා දන්නා ආකාරයට විශ්ව තරණ යන අයගෙන් කිසිදු ප්‍රකාශයක් සටහන් කර ගැනීමක් සිදුකර නොමැති බවත්, තමා මෙම සැකකරුවන් දෙදෙනාට කිසිදු පහර දිමක් සිදුනොකළ බවත්, චෝදනාගාරය තුළ ඉහත දක්වන ලද ඡායාරූප ගත කිරීමේ සිදුවීමේදි කතාබහක් සිදු වුවද ගැටුමක් හෝ පහරදිමක් සිදු නොවූ බව වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත.

හත්වන වගඋත්තරකරු : පො. සැ. 74791 ඩබ්. එම්. ආර්. එල්. විජේසිංහ මයා

2025.07.30 වන දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේදී පවත්වන ලද පරීක්ෂණය සඳහා සහභාගී වෙමින් පහත සඳහන් ප්‍රකාශය ලබාදී ඇත.

2024.12.02 දින ස්ථානයේ කාර්යය භාර නිලධාරියා ලෙස තමා රාජකාරි කටයුතු සිදුකළ බවත්, එදින සවස 5.00 ට පමණ ජංගම සංචාරයේ සිටි නිලධාරින් විසින් අත්අඩංගුවට ගත් විශ්ව තරණ යන අය පොලිස් ස්ථානයට ඉදිරිපත් කර තිබුණු බවත් සඳහන් කර ඇත. එම අවස්ථාවේදි මෙම සැකකරුගේ පියා වන ජී.එන්.එන්. සඳගල යන අය චෝදනාගාරයට පැමිණ ඔහුගේ ජංගම දුරකථනයෙන් වීඩියෝ ගත කරමින් ඔහු මානව හිමිකම් ආයතනයේ නිලධාරියෙක් බව ප්‍රකාශ කරමින් කලහාකාරි ලෙස හැසිරුණු බවත්, එම අවස්ථාවේ එතැන සිටි කා.පො.සැ. 3429 ඉනෝකා නිලධාරිනිය විසින් වීඩියෝ ගත කිරිම සිදු නොකරන ලෙස එම පුද්ගලයාට ප්‍රකාශ කළ බවත්, එය පිළිනොගෙන දිගටම වීඩියෝ ගත කිරිම සිදු කළ බවත්, ඔහු විසින් උපසේවයේ සිටි පො.සැ. 24052 රාජපක්ෂ නිලධාරියාව තල්ලු කරනු ලැබූ බවත්, ඉන්පසු තමා විසින් එම සැකකරු, සාපරාධි බලහත්කාරය පෑම රජයේ නිලධාරින්ට අඩත්තේට්ටම් කිරිම යන වරද කියා දි අත්අඩංගුවට ගැනිම සිදු කළ බවත්, ඊට පසුදින සැකකරුවන් දෙදෙනාවම අධිකරණයට ඉදිරිපත් කළ බවත් ප්‍රකාශ කර ඇත.

අධිකරණ වෛද්‍ය වාර්තාව :

2024.12.02 දින ජී. ඒ. විශ්ව තරණ සඳගල යන අය සහ ජී.එන්.එන්. සඳගල යන අය අත්අඩංගුවට ගෙන 2024.12.03 වන දින අධිකරණ වෛද්‍යවරයා වෙත යොමුකර ඇත.

එදින ජාතික රෝහලේ අධිකරණ වෛද්‍ය නිලධාරි විසින් ජී.එන්.එන්. සඳගල යන අයව පරික්ෂා කිරීමේදී රෝගියා විසින් ලබාදෙන ලද කෙටි ඉතිහාසය යන්නෙහි "මට්ටක්කුලිය පොලිසිය විසින් තම පුතාව අත්අඩංගුවට ගෙන තිබූ බැවින් 2024.12.02 දින සවස 4.00 පමණ තමා එහි ගිය බවත්, පොලිසිය විසින් පුතාට පහරදී තිබූ බැවින් තමා පුතාගේ ඡායාරූපයක් ගැනීමට යාමේදී තමාව බලහත්කාරයෙන් සිරමැදිරියට දමා, රාජකාරියට බාධා කිරීම යටතේ චෝදනා කර අත්අඩංගුවට ගත් බවත්" සටහන් කර ඇත. අධිකරණ වෛද්‍යවරයා විසින් එම රෝගියා පරික්ෂා කිරීමෙන් අනතුරුව නිකුත් කරන ලද අධිකරණ වෛද්‍ය වාර්තාවෙහි "කායික රෝග නිරීක්ෂණය සාමාන්‍ය බවට" සඳහන් කර ඇත.

එදින ජී. ඒ. විශ්ව තරණ සඳගල යන අයව පරික්ෂා කිරීමේදී රෝගියා විසින් වෛද්‍යවරයාට ලබාදෙන ලද කෙටි ඉතිහාසය යන්නෙහි, "2024.12.02 දින මට්ටක්කුලිය පොලිසිය විසින් තමාව අත්අඩංගුවට ගත් බවත්, කාන්තාවක් පැමිණ තමා ඇයට දුරකථනයෙන් තර්ජනය කළ බව පවසා සිටි බවත්, පසුව වී.එම්. ගුණසේකර නිලධාරියා සහ තවත් නිලධාරීන් පිරිසක් තමාව බිම පෙරලාගෙන පහරදුන් බවත්, ඔවුන් අතින්, පයින් සහ බූට් සපත්තු වලින් තමාට පහරදුන් බවත්" සටහන් කර ඇත.

ඒ අනුව මෙම රෝගියා පරික්ෂා කිරීමෙන් අනතුරුව නිකුත් කරන ලද අධිකරණ වෛද්‍ය වාර්තාවෙහි කායික රෝග නිරීක්ෂණය යටතේ,

1. දෘශ්‍යාබාධිත බවක් නොමැත (No Visual Deprivation)
2. වම් කම්මුලට ඉහළින් 1x1 cm ප්‍රමාණයේ කැපුමක්. (1x1 cm laceration over the left cheek)
3. ඔක්සිපිටල් කලාපයේ ඉහළ කොටසේ 1x1 cm ප්‍රමාණයේ තැලීම්. (1x1 cm contusion of the upper part of occipital region)
4. වම් උරහිස ප්‍රදේශයට ඉහළින් සමේ 4x2 cm ප්‍රමාණයේ තැලීම්. (4x2 cm contusion of the skin above left scapula region)
5. ෂින් ප්‍රදේශයේ 4x1 cm ප්‍රමාණයේ ද්විපාර්ශ්වික තැලීම්. (Bilateral contusion 4x1 cm of the shin area)

වශයෙන් අනාවරණය කරගෙන ඇති අතර, 1 සිට 5 දක්වා තුවාල බරපතල නොවන බවට සහ එකී තුවාල සිදුවී ඇත්තේ 'මොට ආයුධ' හේතුවෙන් බවට අධිකරණ වෛද්‍යවරයා විසින් සටහන් කර ඇත.

2024.12.05 වන ජී.එන්.එන්. සඳගල සහ ජී. ඒ. විශ්ව තරණ සඳගල යන අය අධිකරණය වෙත මෝසමක් ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ඇප ලබාගෙන ඇත. අත්අඩංගුවට ගැනීමේදී පොලිස් නිලධාරීන් පහරදීම හේතුවෙන් අසනීප තත්ත්වයේ පසු වූ ජී. ඒ. විශ්ව තරණ සඳගල යන අය 2024.12.07 වන දින නැවත ප්‍රතිකාර ලබාගැනීම සඳහා ජාතික රෝහලට ඇතුළත්වී ඇත. එදින ද ඔහුව පරික්ෂා කර ඇත්තේ, 2024.12.03 වන දින ඔහුව පරික්ෂා කරන ලද අධිකරණ වෛද්‍යවරයා විසින්ම බව අධිකරණ වෛද්‍ය වාර්තා දෙක පරික්ෂා කිරීමේදී අනාවරණය විය.

2024.12.07 වන දින වෛද්‍යවරයා වෙත රෝගියා විසින් ලබාදෙන ලද කෙටි ඉතිහාසයෙහි, "2024.12.02 දින මට්ටක්කුලිය සමිත්පුර අසලදී තමාට පහරදුන් බවත්, පොලිස් ස්ථානයට රැගෙන ගිය පසු නිලධාරීන් විසින් තමාගේ දකුණු අතේ වැලිමිට අසලට, දකුණු මාපටැගිල්ලට, දහ දකුණු පාදයට හොකී පිතිවලින් පහරදුන් බව" සටහන් කර ඇත.

ඉහත රෝගියා රෝගියා පරික්ෂා කරන ලද අධිකරණ වෛද්‍යවරයා විසින් නිකුත් කරන ලද අධිකරණ වෛද්‍ය වාර්තාවෙහි කායික රෝග නිරීක්ෂණය යටතේ,

1. දකුණු අතේ ඉහළ කොටසේ වැලමිට සන්ධියේ සෙ.මී. 2 ක පමණ ට්‍රැම්ලයින් තැලීමක් ඇත. (Tramline contusion on right upper limp 2 cm elbow the elbow joint.)
2. දකුණු අතේ මාපටැඟිල්ලේ තැලීමක් ඇත (Contusion of thumb of the right hand.)
3. දකුණු පාදයේ ඇඟිල්ල අසල 3cm x 2cm පමණ තැලීමක් ඇත. (Contusion to the right foot near the toe's (3cm x 2cm))

වශයෙන් අනාවරණය කරගෙන ඇති අතර, එකී 1,2,3 තුවාල බරපතල නොවන බවට සහ එකී තුවාල සිදුවී ඇත්තේ 'මොට ආයුධ' හේතුවෙන් බවට අධිකරණ වෛද්‍යවරයා විසින් සටහන් කර ඇත.

ඒ අනුව ජී. ඒ. විශ්ව තරණ සඳගල යන අය 2024.12.02 වන දින අත්අඩංගුවට ගත්පසු සිදුවූ සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස පොලිස් රැකවරණයේ සිටියදී මෙම තැනැත්තා තුවාල ලබා ඇති බවත්, එම තුවාල 2024.12.07 වන දින අධිකරණ වෛද්‍යවරයා වෙත දෙවන වරට යොමුවන අවස්ථාව වන තෙක් පැවත ඇති බවත් නිරීක්ෂණය වේ.

නිරීක්ෂණ :

පළමුවන වගඋත්තරකරුවන ප්‍ර.පො.ප. ආර්.ජේ.ආර්.ඩී. කරුණාරත්න මහතා මෙම අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් ප්‍රකාශ කර ඇත්තේ, 2024.12.02 වන දින මට්ටක්කුලිය ඉන්ධනහල අසල අන්තරාදායක ආයුධයක් සමග පුද්ගලයෙකු රැඳී සිටින බවට සහ පහරදීමක් සඳහා පුද්ගලයින් කිහිපදෙනෙකු ඉන්ධනහල අසල රැඳී සිටින බවට, එදින ජංගම සංචාරයේ යෙදී සිටි පො. සැ. 53137 වී. එම්. ආනන්ද ගුණසේකර නිලධාරියාට සහ පො.කො.රි. 80765 එම්.එච්.ජේ. සකලසූරිය යන නිලධාරීන් දෙනොට පැය 17.00 ට පමණ ලද තොරතුරකට අනුව, එම ස්ථානයට ගිය මෙම නිලධාරීන් දෙදෙනා විසින් ජී.ඒ. විශ්ව තරණ සඳගල යන අය අන්තරාදායක ආයුධයක් සමග වරද කියාදී අත්අඩංගුවට ගෙන ඇති බවත්, එම සැකකරු ත්‍රීරෝද රථයකින් තවත් ළමුන් කිහිපදෙනෙකු සමග පැමිණ ඇති අතර එම ළමුන් මෙම ආයුධය සම්බන්ධයෙන් කිසිවක් දැන නොසිටීම හේතුවෙන් එම ළමුන් අත්අඩංගුවට ගැනීම සිදු කර නොමැති බවත් ය.

එහෙත් ජී.ඒ. විශ්ව තරණ සඳගල යන අය අත්අඩංගුවට ගන්නා ලද දෙවන වගඋත්තරකරුවන පො.සැ. 53137 වී.එම්. ආනන්ද ගුණසේකර නිලධාරියා ප්‍රකාශ කර ඇත්තේ, ".....2024.12.02 වන දින දිවා ජංගම සංචාරය අතරතුරදී ශ්‍රී වික්‍රම මාවතේ ඉන්ධනහල අසලට පිරිසක් පහරදීමකට පැමිණ සිටින බවට පොලිස් ස්ථානයේ එදින උපසේවා රාජකාරියේ යෙදී සිටි නිලධාරියා විසින් දුරකථන ඇමතුමක් තමාට ලබාදුන් බවත්, ඒ අනුව ශ්‍රී වික්‍රමපුර ඉන්ධනහල අසලට යන විට වයස අවුරුදු 17, 19 වගේ වයස්වන පිරිමි ළමුන් 6 ක් පමණ රැදී සිටිනු දුටු බවත්, එහි සිටි එක් අයෙක් අත කලුපාට බැග් එකක් සැක කටයුතු ලෙස තිබෙණු දුටු බවත්....." වශයෙනි. ඒ අනුව සැකකරු අත්අඩංගුවට ගන්නා ලද නිලධාරියා සඳහන් කර ඇත්තේ, පොලිස් ස්ථානයේ උපසේවා නිලධාරියා විසින් තමාට ජංගම සංචාරය අතරතුර දුරකථන ඇමතුමක් ලබාදී මෙම තොරතුර දැනුම්දුන් බවයි. 2024.12.02 දින උපසේවා රාජකාරී කටයුතුවල නිරත වූ හයවන වගඋත්තරකරුවන පො. කො. 24052 ආර්. ආර්. රාජපක්ෂ නිලධාරියා විසින් කොමිෂන් සභාවට ලබාදී ඇති ප්‍රකාශය තුළ, එම නිලධාරියා විසින් දෙවන වගඋත්තරකරුවන පො.සැ. 53137 වී. එම්. ආනන්ද ගුණසේකර නිලධාරියා වෙත මට්ටක්කුලිය ඉන්ධනහල අසල පිරිසක් රැදී සිටින බවට ඇමතුමක් ලබාදී දැනුම්දීමක් සිදුකළ බව සඳහන් කර නොමැත. ඒ අනුව දෙවන වගඋත්තරකරුවන පො.සැ. 53137 වී.එම්. ආනන්ද ගුණසේකර නිලධාරියා විසින් ඔහුට එම තොරතුර ලැබුණු ආකාරය සම්බන්ධයෙන් කොමිෂන් සභාවට ලබාදී ඇති ප්‍රකාශය සාවද්‍ය බව නිරීක්ෂණය වේ.

එමෙන්ම, දෙවන වගඋත්තරකරුවන පො.සැ. 53137 වී. එම්. ආනන්ද ගුණසේකර නිලධාරියා විසින් මට්ටක්කුලිය පොලිස් ස්ථානයේ ගමන් සටහන් තොරතුරු සටහන් පොතේ 2024.12.02 දින පැය

17.55 පිටුව 104, ඡේදය 42 යටතේ යොදා ඇති සටහන් නිරීක්ෂණය කිරීමේදී, "... පුද්ගලයෙකු ස්ථානයට පැමිණ දන්වා සිටියා ශ්‍රී වික්‍රමපුර ඉන්ධනහල අසල පුද්ගලයෙකු කඩු තබාගෙන සිටින බව. පො.කො.රි. 80765 එම්.එච්.ජේ. සකලසූරිය නිලධාරියා සමග ඉන්ධනහල අසලට ගොස් පැය 16.00 ට පරික්ෂා කළෙමි. පුද්ගලයන් 06 දෙනෙක් වැනි සංඛ්‍යාවක් සිටි අතර එම පුද්ගලයන් සැක සහිත බව මා හට වැටහී ගිය බැවින් මා විසින් ඔවුන් ජංගම රථයට දමා ගැනීමට උත්සාහ කිරීමේදී කලහකාරී ලෙස හැසිරෙන ලද ආකාශ් විශ්ව තරණ සඳගල යන අය පැය 16.30 ට අත්අඩංගුවට ගෙන...." යනුවෙන් සටහන් යොදා ඇති බව නිරීක්ෂණය වේ. එකී සටහනෙහි දක්වා ඇත්තේ ඉන්ධනහල අසල රැදී සිටි ජී.ඒ. විශ්ව තරණ සඳගල සහ ඔහුගේ මිතුරන් පිළිබඳව සැක සිතුණු බැවින් එම තරුණයින් ජංගම රථයට නංවාගැනීමට උත්සාහගත් බවයි. ඒ අනුව දෙවන වගඋත්තරකරු ගමන් සටහන් තොරතුරු සටහන් පොතේ සටහන් කරන ලද තොරතුරු හා කොමිෂන් සභාව වෙත ලබාදෙන ලද ප්‍රකාශයෙහි සඳහන් කරුණු එකිනෙකට පරස්පර විරෝධී බව පෙනීයයි.

තවද, දෙවන වගඋත්තරකරුවන පො.සැ. 53137 වී. එම්. ආනන්ද ගුණසේකර නිලධාරියා සමග එදින දිවා ජංගම රාජකාරී කටයුතුවල යෙදුනු තුන්වන වගඋත්තරකරුවන පො.කො.රි. 80765 එම්. එච්. ජේ. සකලසූරිය නිලධාරියා ප්‍රකාශ කර ඇත්තේ, "....පො. සැ. 53137 වී. එම්. ආනන්ද ගුණසේකර නිලධාරියා සමග දිවා ජංගම සංචාර රාජකාරි කටයුතු කරමින් සිටි බවත්, තේ පානය කිරිමට සහ දිවා ආහාරය ලබාගැනීමට සංචාරය අතරතුර වරින්වර පොලිස් ස්ථානයට පැමිණි බවත්, එසේ පැමිණි අවස්ථාවක ඉන්ධනහල අසල කඩුවලින් පහර දීමට පිරිසක් පැමිණ සිටින බවට පොලිස් ස්ථානයට දුරකථන ඇමතුමක් ලැබී තිබූ බවත්, ඒ අනුව පො. සැ. 53137 වී. එම්. ආනන්ද ගුණසේකර නිලධාරියා විසින් ඉහත තොරතුර පිළිබඳව තමාව දැනුවත් කරමින්, ඉන්ධනහල අසලට එය බැලීම සඳහා යායුතු බව දැනුම්දුන් බවත්......" යනුවෙනි. තුන්වන වගඋත්තරකරුවන පො. කො. රි. 80765 එම්.එච්.ජේ. සකලසූරිය නිලධාරියා ප්‍රකාශ කරන ආකාරයට, මට්ටක්කුලිය ඉන්ධනහල අසලට පිරිසක් පහරදීමක් සඳහා පැමිණ සිටින බවට තොරතුර ලැබී ඇත්තේ පොලිස් ස්ථානයේ දුරකථනයට වේ.

ඒ අනුව මට්ටක්කුලිය ඉන්ධනහල අසල පහරදීමක් සඳහා පිරිසක් පැමිණ සිටින බවට වූ තොරතුර ලැබුණු ආකාරය සම්බන්ධයෙන් පළමු, දෙවන හා තුන්වන වගඋත්තරකාර නිලධාරීන් කොමිෂන් සභාවට ලබාදී ඇති ප්‍රකාශ තුන එකිනෙකට පරස්පර විරෝධී බව නිරීක්ෂණය වේ.

මෙම අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් මට්ටක්කුලිය පොලිස් ස්ථානය වෙතින් වාර්තා කැඳවීමක් සිදුකර ඇත. ඒ අනුව යොමුකරන ලද උදෘත සහිත වාර්තාවල මට්ටක්කුලිය පොලිස් ස්ථානයේ විවිධ පැමිණිලි තොරතුරු පොතේ පිටුව 243, ඡේදය 08 පරිදි පැය 16.00 ට 2024.12.02 දින සටහන් කරන ලද පැමිණිල්ල තුළ, "වයස අවුරුදු 18 ක් වූ තිමිර කවිෂ්ක යන අය විසින් ආකාශ් විශ්ව යන අය පිරිසක් සමග ත්‍රීවීල් දෙකකින් පැමිණ ඉන්ධනහල අසල තමාට පහරදීමට රැදී සිටින බවට" යනුවෙන් පැමිණිල්ලක් සටහන් කර ඇති බවත්, එකී පැමිණිල්ල සටහන් කර ඇත්තේ, හත්වන වගඋත්තරකරුවන පො. සැ. 74791 ඩබ්.එම්.ආර්.එල්. විජේසිංහ නිලධාරියා විසින් බවත් නිරීක්ෂණය වේ. එහෙත් මෙවැනි පැමිණිල්ලක් එදින සටහන් කළ බවට හත්වන වගඋත්තරකරු විසින් කොමිෂන් සභාව වෙත ලබාදෙන ලද ප්‍රකාශයෙහි සඳහන් කර නොමැති අතර,

එම නිලධාරියාගේ ප්‍රකාශයෙහි දක්වා ඇත්තේ, “.....2024.12.02 දින ස්ථානයේ කාර්යය භාර නිලධාරියා ලෙස තමා රාජකාරි කටයුතු සිදුකළ බවත්, එදින සවස 5.00 ට පමණ ජංගම සංචාරයේ යෙදී සිටි නිලධාරින් විසින් අත්අඩංගුවට ගත් විශ්ව තරණ යන අය පොලිස් ස්ථානයට ඉදිරිපත් කර තිබුණු බවත්......” ආදී වශයෙනි.

ඒ අනුව මෙම පැමිණිල්ලේ අගතියටපත් පාර්ශවය වන වයස අවුරුදු 19 ක් වූ ජී. ඒ. විශ්ව තරණ සඳගල යන අත්අඩංගුවට ගැනීමට හේතුවූ “මට්ටක්කුලිය ඉන්ධනහල අසල පහරදීමට පිරිසක් රැදී සිටින බවට” යන තොරතුර ලැබුණු ආකාරය සම්බන්ධයෙන් වගඋත්තරකාර පාර්ශවයන් ලබාදී ඇති ප්‍රකාශ එකිනෙකට පරස්පර විරෝධී බව නිරීක්ෂණය වේ.

තවද, 2024.12.02 දින මට්ටක්කුලිය පොලිස් ස්ථානයේ විවිධ පැමිණිලි අංශයේ 243/08 පරිදි සටහන් කරන ලද පැමිණිල්ල එදින පැය 16.00 ට සටහන් කර ඇති අතර, සැකකරු අත්අඩංගුවට ගැනීම පැය 16.30 ට සිදුකර ඇත. සැකකරු අත්අඩංගුවට ගත් ඉන්ධනහල පිහිටා ඇත්තේ මට්ටක්කුලිය පොලිස් ස්ථානයට පේනදුරින් බව දෙවන වගඋත්තරකරුවන පො.සැ. 53137 වී. එම්. ආනන්ද ගුණසේකර නිලධාරියාගේ ප්‍රකාශයෙහි, “......එම අවස්ථාවේදී පොලිස් ස්ථානයෙන් තවත් නිලධාරීන් තිදෙනෙක් පමණ එම ස්ථානයට පැමිණි බවත්, ඉන්ධනහල පිහිටා ඇත්තේ පොලිස් ස්ථානයට පේනදුරින් වන බැවින්......” යනුවෙන් සඳහන් කර ඇත.

මෙම සියලුම කරුණු අනුව, 2024.12.02 වන දින පැය 16.00 පොලිස් ස්ථානයට ලද පැමිණිල්ල පිළිබඳව සඳහන් නොකිරීම සහ අදාළ තොරතුර ලද ආකාරය පිළිබඳව පරස්පර විරෝධී ප්‍රකාශ ලබාදීම තුළින් ජී.ඒ. විශ්ව තරණ සඳගල යන අය අත්අඩංගුවට ගැනීම වගඋත්තර නිලධාරීන් විසින් නිසි විමර්ශනයකින් තොරව අත්තනෝමතික ආකාරයට සිදුකර ඇති බව කොමිෂන් සභාවට නිරීක්ෂණය වේ.

තවද, ජී.ඒ. විශ්ව තරණ සඳගල යන අය 2024.12.03 වන දින අධිකරණයට ඉදිරිපත් කරන ලද බී 3293006/2024 දරණ බී වාර්තාවෙහි සඳහන් කර ඇත්තේ, “....එම්.ඕ.අයි.බී. 243/08 දරණ පැමිණිලි අංක යටතේ සිදුකරන ලද පැමිණිල්ල අනුව විමර්ශනය ආරම්භ කර ජංගම රථයේ නිලධාරීන් දැනුවත් කර සිදුවන්නට යන අපරාධය වැළැක්වීම සඳහා කටයුතු කරමින් සිටියදී ඉන්ධනහල අසල සංවිධානාත්මක අපරාධ කණ්ඩායමක් රැදී සිටින බවට ජංගම රථයේ රාජකාරී නියුතු පො. සැ. 53137 වී. එම්. ආනන්ද ගුණසේකර ගුණසේකර නිලධාරියා ඇතුළු නිලධාරීන් කණ්ඩායමක් ඉන්ධනහල අසලට ගමන් කිරීමේදී තරුණයන් කිහිප දෙනෙකු ඉන්ධනහල අසල සිට දිවගොස් ඇති අතර, කොණ්ඩය වවා දිග කලිසමක් ඇඳ සිටි තරුණයෙකු යමක් අතට ගෙන ඔහු අසලට ලං නොවන බව පවසමින් කුණුහරුපයෙන් බැණ වදිමින් සැකකරු අත්අඩංගුවට ගැනීමට නොදුන් බවත්, නිලධාරීන් මහත් පරිශ්‍රමයක් යොදා අවම බලය පාවිච්චි කර සැකකරු අත්අඩංගුවටගත් බවත්...” යනුවෙනි. තවද එකී බී වාර්තාවෙහි, මේ සම්බන්ධයෙන් විමර්ශනයේදී සැකකරු විසින් සංවිධානාත්මක අපරාධයක් සිදු කිරීමට පැමිණි බව සඳහන් කරමින් සාක්ෂි ලෙස, “විහග නිම්සර යන අය ස්ථානයට පැමිණ ප්‍රකාශයක් ලබාදෙමින්..... වශයෙන් ද, පසන් මිගාර ස්ථානයට පැමිණ ප්‍රකාශයක් ලබාදෙමින්...... වශයෙන් ද, ජයරාජා සචින් යන අය ස්ථානයට පැමිණ ප්‍රකාශයක් ලබාදෙමින්......” වශයෙන් ද ප්‍රකාශ

03 ක් බී වාර්තාවෙහි ඇතුළත් කර ඇත. එකී ප්‍රකාශ තුනෙහි සඳහන් වන්නේ, "ආකාශ් විශ්ව තරණ සමග ඔවුන් ඉන්ධනහල අසලට පැමිණි බවත්, ඉන්ධනහල අසලදී ආකාශ් විශ්ව තරණ විසින් තිමිර කවිශ්ක යන අයට (243/08 යටතේ පොලිස් ස්ථානයට පැමිණිල්ලක් ඉදිරිපත් කළ අය) දුරකථන ඇමතුමක් ලබාදී මරණ තර්ජන කළ බවත්, ආකාශ් විශ්ව තරණ අතෙහි පත්තර කොළවලින් ඔතන ලද දිග යමක් තිබූ බවත්" යන කරුණු වේ.

එහෙත් බී වාර්තාවෙහි සඳහන් කරන ලද ඉහත සාක්ෂිකරුවන් සම්බන්ධයෙන් වගඋත්තර පාර්ශවය විසින් කොමිෂන් සභාව වෙත ලබාදෙන ලද ප්‍රකාශවල සඳහන් කර නොතිබුණි. එබැවින් එකී සාක්ෂි සටහන් සම්බන්ධයෙන් මට්ටක්කුලිය පොලිස් ස්ථානය වෙතින් විමසීමේදී, 2026.08.31 දිනැතිව ඉහත සාක්ෂිකරුවන්ගේ ප්‍රකාශ සටහන් කොමිෂන් සභාව වෙත යොමුකරන ලදි. එම සටහන් නිරීක්ෂණය කිරීමේදී 2024.12.02 දින පැය 23.00 සහ පැය 00.10 ට සාක්ෂි සටහන් කර ඇති බව නිරීක්ෂණය විය. එම ප්‍රකාශ සටහන් සහිත උදෘතවල, "......ඉන්පසු අපි පොලිසිය ලගට එනකොට ආකාශ් පොලිසියෙ මහත්තුරු මට්ටක්කුලිය පොලිසියට එක්කගෙන එනවා. ඒ වෙලාවෙ තමයි මම දන්නෙ ආකාශ් කරවල කුරියෙක් කියලා ගෙනල්ලා තියෙන්නෙ කඩුවක් කියලා. ඉන්පසු අපි සෙල්ලම් කරන්න ගියා...." යනුවෙන් සහ "......මහත්තුරු ඇවිත් ආකාශ්ව පොලීසියට එක්කගෙන ආවා. අපිත් ඒ පස්සෙන් ආවා....." යනුවෙන් සටහන් කර ඇත. එකී ප්‍රකාශ සටහන් අනුව පෙනීයන්නේ, ජී.ඒ. විශ්ව තරණ සඳගල යන අය අත්අඩංගුවට ගෙන පොලිස් ස්ථානයට ජීප් රථයෙන් රැගෙන එන අවස්ථාවේ ඔහුගේ මිතුරන් තිදෙනා ද පොලිස් ස්ථානය අසලට පැමිණ ඇති බවයි. ඒ අනුව සැකකරු සමග සිටි අනෙක් පිරිස පොලිස් ස්ථානය අසලට එම අවස්ථාවේදීම පැමිණ තිබුණ ද වගඋත්තර නිලධාරීන් විසින් ඔවුන්ගෙන් එම අවස්ථාවේදී ප්‍රකාශ ලබාගැනීම සිදුනොකර, ඔවුන් එදින රාත්‍රී 10.00 පසුවී පොලිස් ස්ථානයට නැවත කැඳවා ප්‍රකාශ ලබාගැනීමට කටයුතු කර ඇති බව නිරීක්ෂණය වේ. ඒ අනුව අන්තරාදායක ආයුධයක් සහිතව සංවිධානාත්මකව පහරදීමට පැමිණි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන තිබියදී ඔහු සමග පැමිණි අනෙක් පුද්ගලයන්ගෙන් ප්‍රශ්න කර ප්‍රකාශ සටහන් කර ගැනීමේදී පොලිස් නිලධාරීන් මන්දගාමී ක්‍රියාපටිපාටියක් අනුගමනය කර ඇති බව නිරීක්ෂණය වේ.

විශේෂයෙන් බී වාර්තාවෙහි සඳහන් කර ඇත්තේ, "පො. සැ. 53137 වී. එම්. ආනන්ද ගුණසේකර ගුණසේකර නිලධාරියා ඇතුළු නිලධාරීන් කණ්ඩායමක් ඉන්ධනහල අසලට ගමන් කිරීමේදී තරුණයන් කිහිප දෙනෙකු ඉන්ධනහල අසල සිට දිවගොස් ඇති අතර....." යනුවෙන් ද, තුන්වන වගඋත්තරකරුවන පො.කො.රි. 80765 එම්.එච්.ජේ. සකලසූරිය නිලධාරියාගේ ප්‍රකාශයෙහි, ".......එතැන සිටි එක් පිරිමි ළමයෙක් අතේ කලු පාට බැග් එකක් තිබෙණු දුටු බවත් තමන් දෙදෙනා විසින් එම බැගය පරීක්ෂා කිරිමට යාමේදී එතැන සිටි ළමුන් විසිර ගිය බවත්, බැගය අතේ තිබුණු ළමයා පමණක් රැදී සිටි බවත්..." යනුවෙන් ද, පො. සැ. 53137 වී. එම්. ආනන්ද ගුණසේකර ගුණසේකර නිලධාරියාගේ ප්‍රකාශයෙහි සඳහන් කර ඇත්තේ, "....තමා පො. කො. රි. 80765 එම්. එච්. ජේ. සකලසූරිය නිලධාරියාට එම බැගය පරීක්ෂා කරන ලෙසට උපදෙස් ලබාදුන් බවත්, එම පිරිස පයින් පැමිණ සිටි බවත්, එම ස්ථානයේ රැස්ව සිටි ළමුන්ගෙන් දෙදෙනෙක් පසෙකටවී සිටි බවත්....."

වශයෙනි. මේ අනුව සැකකරු අත්අඩංගුවට ගත් නිලධාරීන් දෙදෙනා විසින් ලබාදී ඇති ප්‍රකාශ සහ බී වාර්තාවෙහි සටහන් කර ඇති කරුණු එකිනෙකට පරස්පර විරෝධීවන බව නිරීක්ෂණය වේ.

ඒ අනුව සැකකරු අත්අඩංගුවට ගන්නා අවස්ථාවේදී ඔහු සමග සිටි පිරිස දිවගියා නම් සාක්ෂි කරුවන් විසින් එම ස්ථානයේ සිදුවූ සිදුවීම ඇසින් දුටු බවට ලබාදී ඇති ප්‍රකාශ නිවැරදිද යන්න ගැටලු සහගත වේ.

තවද, පළමුවන වගඋත්තරකරුවන ප්‍ර.පො.ප. ආර්.ඒ.ආර්.ඩී.කරුණාරත්න නිලධාරියාගේ ප්‍රකාශයෙහි, "........එම සැකකරු ත්‍රිරෝද රථයකින් තවත් ළමුන් කිහිපදෙනෙකු සමග පැමිණ ඇති අතර, එම ළමුන් මෙම ආයුධය සම්බන්ධයෙන් කිසිවක් දැන නොසිටීම හේතුවෙන් එම ළමුන් අත්අඩංගුවට ගැනීම සිදු කර නොමැති බවත්......." යනුවෙන් සඳහන් කර ඇත. ඒ අනුව ආකාශ් විශ්ව තරණ යන අය සමග සිටි අනෙක් තරුණයින් පොලිස් ස්ථානයට රැගෙන ගොස් නොමැති බව නිරීක්ෂණය වේ. එමෙන්ම, දෙවන වගඋත්තරකරුවන පො. සැ. 53137 වී. එම්. ආනන්ද ගුණසේකර නිලධාරියාගේ ප්‍රකාශයෙහි, "......ශ්‍රී වික්‍රමපුර ඉන්ධනහල අසලට යන විට වයස අවුරුදු 17, 19 වගේ වයස්වල පිරිමි ළමුන් 6 ක් පමණ රැදී සිටිනු දුටු බවත් .... එම පිරිස පැමිණ සිටියේ වාහනයක නොවන බවත් එම පිරිස පයින් පැමිණ ඇති බවත්, එම ස්ථානයේ රැස්ව සිටි ළමුන්ගෙන් දෙදෙනෙක් පසෙකටවී සිටි බවත්........." වශයෙන් සඳහන් කර ඇත. තුන්වන වගඋත්තරකරුවන පො.කො.රි. 80765 එම්.එච්.ජේ. සකලසූරිය නිලධාරියාගේ ප්‍රකාශයෙහි, ".......එතැන සිටි එක් පිරිමි ළමයෙක් අතේ කලු පාට බැග් එකක් තිබෙණු දුටු බවත් තමන් දෙදෙනා විසින් එම බෑගය පරික්ෂා කිරීමට යාමේදී එතැන සිටි ළමුන් විසිර ගිය බවත්..." වශයෙන් සඳහන් කර ඇත. ඒ අනුව ජී.ඒ. විශ්ව තරණ සඳගල යන සැකකරු සමග සංවිධානාත්මක අපරාධයකට මෙම තරුණ පිරිස පැමිණ සිටියේ නම් සැකකරු සමග පැමිණි පිරිස ද අත්අඩංගුවට ගැනීම කළ යුතු වුවද, අත්අඩංගුවට ගැනීම සිදුකර ඇත්තේ ජී.ඒ. විශ්ව තරණ සඳගල යන අය පමණක් බව නිරීක්ෂණය වේ.

එමෙන්ම, "අන්තරාදායක වරදක් කළ හැකි ආයුධයක් ලග තබාගැනීම" යටතේ ජී. ඒ. විශ්ව තරණ සඳගල යන අය අත්අඩංගුවට ගෙන ඇති අතර, සැකකරු සන්තකයේ තිබූ බව සඳහන් වන 'කඩුව' සම්බන්ධයෙන් වගඋත්තර පාර්ශවය ලබාදී ඇති ප්‍රකාශයන් එකිනෙකට පරස්පරවිරෝධී වේ. තුන්වන වගඋත්තරකරුවන පො.කො.රි. 80765 එම්.එච්.ජේ. සකලසූරිය නිලධාරියාගේ ප්‍රකාශයෙහි, ".......එතැන සිටි එක් පිරිමි ළමයෙක් අතේ කලු පාට බැග් එකක් තිබෙණු දුටු බවත් තමන් දෙදෙනා විසින් එම බෑගය පරික්ෂා කිරීමට යාමේදී එතැන සිටි ළමුන් විසිර ගිය බවත්..." වශයෙන් සඳහන් කර ඇති අතර, එම ප්‍රකාශයෙහිම, "....... තමන් එම ස්ථානයේදී බෑගය විවෘත කර නොබැලූ බවත්, බෑගය පිටතින් අල්ලා බැලූ පසු එහි කඩුවක් ඇති බවට හැඟී ගිය බවත්, පොලිස් ස්ථානයට පැමිණි පසු බෑගය විවෘත කර බැලූ විට එහි අලුත් කඩුවක් තිබූ බවත්....." යනුවෙන් සඳහන් කර ඇත. සැකකරු අත්අඩංගුවට ගත් නිලධාරියාවන පො. සැ. 53137 වී. එම්. ආනන්ද ගුණසේකර නිලධාරියා (දෙවන වගඋත්තරකරු) එම ආයුධය සම්බන්ධයෙන් ප්‍රකාශ කර ඇත්තේ, "........එහි සිටි එක් අයෙක් අත කලුපාට බැග් එකක් සැක කටයුතු ලෙස තිබෙණු දුටු බවත්, තමා පො. කො. රි. 80765 එම්. එච්. ජේ. සකලසූරිය නිලධාරියාට එම බෑගය පරික්ෂා කරන ලෙසට උපදෙස් ලබාදුන් බවත්.......තමන් විසින්

ආකාශ් විශ්ව තරණ යන අයගේ අතේ තිබූ බෑගය උදුරාගත් බවත්, එය පරික්ෂා කිරීමේදි දිග අලුත් සුදු පැහැති කඩුවක් දැක ගැනීමට හැකි වූ බවත්......." යනුවෙනි. ඒ අනුව ඉන්ධනහල වෙත ගොස් සැකකරු අත්අඩංගුවට ගැනීමට සම්බන්ධ වූ නිලධාරීන් දෙදෙනා විසින් නඩු භාණ්ඩය පරික්ෂා කිරීම සම්බන්ධයෙන් ලබාදී ඇති ප්‍රකාශ එකිනෙකට පරස්පර වන බව නිරීක්ෂණය වේ.

තවද, අධිකරණයට කරුණු වාර්තා කරන ලද බී වාර්තාවෙහි සැකකරු අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් දක්වා ඇත්තේ, ".......පො. සැ. 53137 වී. එම්. ආනන්ද ගුණසේකර ගුණසේකර යන නිලධාරියා සමග නිලධාරීන් කණ්ඩායමක් ඉන්ධනහල අසලට ගමන් කිරීමේදී තරුණයන් කිහිප දෙනෙකු ඉන්ධනහල අසල සිට දුව ගොස් ඇති අතර, කොණ්ඩය වවා දිග කලිසමක් ඇඳ සිටි තරුණයෙකු යමක් අතට ගෙන ඔහු අසලට ලංනොවන බව පවසමින් කුණු හරුපයෙන් බැන වදිමින් සැකකරු අත්අඩංගුවට ගැනීමට නොදී....." යනුවෙනි. ඉහත බී වාර්තාව තුළ සඳහන් කර ඇති කිසිදු කරුණක් වගඋත්තර පාර්ශවය විසින් කොමිෂන් සභාව වෙත ප්‍රකාශ කර නොමැති අතර, පො.සැ. 53137 වී.එම්. ආනන්ද ගුණසේකර නිලධාරියා (දෙවන වගඋත්තරකරු) විසින් ගමන් සටහන් තොරතුරු සටහන් පොතෙහි 104/42 යටතේ බී වාර්තාවෙහි දක්වා ඇති කරුණු සටහන් කර නොමැති බව නිරීක්ෂණය වේ.

අගතියටපත් පාර්ශවය වන ජී. ඒ. විශ්ව තරණ සඳගල යන අයගේ ප්‍රකාශයෙහි සඳහන් කර ඇත්තේ, ".....එම අවස්ථාවේ රේණුකා නැමති කාන්තාව සෙනඟ අතරින් පැමිණ පත්තර කොළ වලින් ඔතන ලද යමක් පොලිස් නිලධාරීන්ට ලබාදී, "මේ ආයුධය ආකාශ් තමයි අරගෙන ආවේ" යැයි ප්‍රකාශ කළ බවත්, තමා එය කුමක්ද යන්න නොදුටු බවත්, මෙම සිදුවීම ආරම්භවන අවස්ථාවේදීම තමා සමග පැමිණි යහළුවන් එම ස්ථානයෙන් පිටව ගිය බවත්...." වශයෙනි.

එමෙන් මෙම සිදුවීම සම්බන්ධයෙන් සටහන් කරන ලද සාක්ෂිකරුවන් තිදෙනා ජී. ඒ. විශ්ව තරණ සඳගල යන අය සමග පැමිණි මිතුරන් තිදෙනෙකු වන අතර, එකී සාක්ෂි සටහන් සහිත උදෘත පරික්ෂා කිරීමේදී සැකකරු සන්තකයේ කළු පාට බෑග් එකක් තිබූ බවට සටහන් කර නොමැති බවත්, ".........ආකාශ්ගෙ යාලුවෙකුගේ අතේ කරවල කුරියෙකු ඔතාගෙන ආවා යැයි පැවසූ පත්තර වලින් ඔතපු දිග යමක් තිබුණා. මම දන්නෙ නෑ ඒ මොකද්ද කියලා..." වශයෙන් ද, ".......ආකාශ්ගෙ අතේ පත්තර වලින් ඔතපු යමක් තිබුණා. අපි ඇහුවාම ආකාශ් කිවුවා මාළු කුරියෙක් ලියලා...." වශයෙන් සටහන් කර ඇති බව නිරීක්ෂණය වේ. ඒ අනුව සැකකරුගේ මිතුරන් විසින් ලබාදී ඇති සාක්ෂි ද එකිනෙකට පරස්පර විරෝධී බවත්, එකී සාක්ෂිවල කළු පාට බෑගයක් පිළිබඳව සඳහන් නොවන බවත් පෙනීයයි.

එමෙන්ම, සැකකරු අත්අඩංගුවට ගන්නා ලද දෙවන හා තෙවන වගඋත්තරකරුවන්ගේ ප්‍රකාශවල එම ආයුධය පරික්ෂා කිරීම, සැකකරු අත්අඩංගුවට ගන්නා ලද ස්ථානයේදී සිදු කළාද, නැතහොත් පොලිස් ස්ථානයට පැමිණි පසු පරික්ෂා කළා ද යන්න ගැටලු සහගත වේ. ඒ අනුව සැකකරු සන්තකයේ තිබූ බව වගඋත්තරකරුවන් විසින් සඳහන් කරන ආයුධය සම්බන්ධයෙන් වගඋත්තරකාර නිලධාරීන් ඉදිරිපත් කරන කරුණු සහ සාක්ෂි කරුවන්ගේ ප්‍රකාශ, බී වාර්තාව යනාදී සියල්ල එකිනෙකට පරස්පර

විරෝධී ස්වරූපයක් ගන්නා බව නිරීක්ෂණය වේ. ජී.ඒ. විශ්ව තරණ සඳගල යන අය අත්අඩංගුවට ගනු ලබන්නේ, "මරණ තර්ජනය කර සංවිධානාත්මකව පහර දීමට පැමිණ අන්තරාදායක ආයුධයක් ලඟ තබාගැනීම" චෝදනාව මත වන අතර, අත්අඩංගුවට ගැනීමට පෙර සැකකරු සන්තකයේ එවැනි ආයුධයක් තිබූ බව ඉහත පරස්පර විරෝධී ප්‍රකාශ මගින් තහවුරු නොවන බව පෙනීයයි. එබැවින් සැකකරු උක්ත චෝදනාව යටතේ අත්අඩංගුවට ගැනීම තුළින් පොලිස් නිලධාරීන් නෛතික පටිපාටීන් උල්ලංඝනය කරමින් අත්තනෝමතික ආකාරයෙන් කටයුතු කර ඇති බව කොමිෂන් සභාවට නිරීක්ෂණය වේ.

හතරවන වගඋත්තරකරු වන පො. සැ. 12104 ආර්. එස්. කේ. ඒ. ප්‍රියන්ත නිලධාරියාගේ ප්‍රකාශයෙහි ඔහු විසින් ජී.ඒ. විශ්ව තරණ සඳගල යන අය අධිකරණයට ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය බී වාර්තා සකස් කරලන ලද බව, "........මෙම සැකකරුවන් දෙදෙනා 2024.12.03 වන දිනට අධිකරණයට ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය බී වාර්තා සකස් කර රාත්‍රී විවේකය වාර්තා කර නිවසට පිටව ගිය බව....." වශයෙන්, කොමිෂන් සභාව වෙත ලබාදෙන ලද ප්‍රකාශය මගින් අනාවරණය වේ. උසාවි රාජකාරී භාර නිලධාරියා විසින් බී වාර්තා සකස් කිරීම සිදුකරනු ලබන්නේ, අත්අඩංගුවට ගැනීම සිදුකරන ලද නිලධාරීන් විසින් හෝ විමර්ශන නිලධාරියා විසින් තොරතුරු සටහන් පොත්වල සටහන් කරන කරුණු අනුව වේ. ජී.ඒ. විශ්ව තරණ සඳගල යන අය අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් පො.සැ. 53137 වී.එම්. ආනන්ද ගුණසේකර නිලධාරියා (දෙවන වගඋත්තරකරු) විසින් ගමන් සටහන් තොරතුරු සටහන් පොතෙහි 104/42 යටතේ යොදන ලද සටහන්වල, බී වාර්තාවෙහි දක්වා ඇති ".....කොණ්ඩය වවා දිග කලිසමක් ඇඳ සිටි තරුණයෙකු යමක් අතට ගෙන ඔහු අසලට ලංනොවන බව පවසමින් කුණුහරුපයෙන් බැන වදිමින් සැකකරු අත්අඩංගුවට ගැනීමට නොදී.... " යනාදී වශයෙන් කරුණු සටහන් කිරීමක් සිදුකර නොමැති බව උද්ධෘත සටහන් විමර්ශනය කිරීමේදී පෙනීයයි. ඒ අනුව මට්ටක්කුලිය පොලිස් ස්ථානයේ උසාවි රාජකාරී සිදු කරනු ලබන හතරවන වගඋත්තරකරු වන පො. සැ. 12104 ආර්.එස්.කේ.ඒ. ප්‍රියන්ත නිලධාරියා විසින් තොරතුරු සටහන් පොත්වල සටහන් කර නොමැති කරුණු ඇතුළත් කරමින් අධි වාර්තා කිරීමක් සිදුකර ඇති බව නිරීක්ෂණය වේ. එමගින් උසාවි රාජකාරී කටයුතුවල නියුතු නිලධාරියා වශයෙන් හතරවන වගඋත්තරකරු නිසි ලෙස රාජකාරී ඉටුනොකර අත්තනෝමතික ආකාරයට සටහන් යොදා ඇති බව පෙනීයයි.

එමෙන්ම ඉන්ධනහල අසලට සැකකරු පැමිණ සිටි ආකාරය සම්බන්ධයෙන් ද වගඋත්තරකරුවන් ලබාදී ඇති ප්‍රකාශයන් පරස්පර විරෝධී බව නිරීක්ෂණය වේ. එනම්, පළමුවන වගඋත්තරකරුවන ස්ථානාධිපති ප්‍ර.පො.ප. ආර්.ඒ.ආර්.ඩී. කරුණාරත්න නිලධාරියා ප්‍රකාශ කර ඇත්තේ, "......එම සැකකරු ත්‍රිරෝද රථයකින් තවත් ළමුන් කිහිපදෙනෙකු සමග පැමිණ ඇති අතර......" යනුවෙනි. අත්අඩංගුවට ගැනීම සිදුකළ දෙවන වගඋත්තරකරුවන පො.සැ. 53137 වී.එම්. ආනන්ද ගුණසේකර නිලධාරියාගේ ප්‍රකාශයෙහි සඳහන් කර ඇත්තේ, ".......තමා පො. කො. රි. 80765 එම්. එච්. ජේ. සකලසූරිය නිලධාරියාට එම බෑගය පරීක්ෂා කරන ලෙසට උපදෙස් ලබාදුන් බවත්, එම අය පැමිණ සිටියේ වාහනයක නොවන බවත් එම පිරිස පයින් පැමිණ ඇති බවත්....." යනුවෙනි. ඒ අනුව මෙම

සැකකරු සංවිධානාත්මකව පහරදීමට පැමිණ ඇතැයි වගඋත්තරකාර නිලධාරීන් ප්‍රකාශ කළත් ඒ සම්බන්ධයෙන් නිසි විමර්ශනයක් සිදුකර නොමැති බව නිරීක්ෂණය වේ.

එමෙන්ම, මෙම අත්අඩංගුවට ගැනීමේ දක්නට ලැබෙන තවත් ක්‍රියා පටිපාටික දෝෂයක් වන්නේ, "මරණ තර්ජනය කර සංවිධානාත්මකව පහර දීමට පැමිණ අන්තරාදායක ආයුධයක් ලග තබාගැනීම" යන චෝදනාව මත පුද්ගලයෙකු අත්අඩංගුවට ගෙන තිබියදීත්, පොලිස් නිලධාරීන් විසින් සැකකරුවන ජී.ඒ. විශ්ව තරණ සඳගල යන අයගෙන් කිසිදු ප්‍රකාශයක් සටහන් කර නොගැනීමයි. 2026.08.31 දිනැතිව මානව හිමිකම් කොමිෂන් සභාව වෙත යොමුකරන ලද වාර්තාව මගින්, 2024.12.02 දින අත්අඩංගුවට ගත් ජී. ඒ. විශ්ව තරණ සඳගල යන අයගෙන් ප්‍රකාශයක් ලබාදෙන නොමැති බවත් සැකකරු අත්අඩංගුවට ගෙන අධිකරණය වෙත ඉදිරිපත් කිරීමෙන් පසු මෙම සිදුවීම සම්බන්ධයෙන් වැඩිදුර විමර්ශනයක් සිදුකර නොමැති බවත් සඳහන් කර ඇත. ජී. ඒ. විශ්ව තරණ සඳගල යනු වයස අවුරුදු 19 ක තරුණයෙකු වන බැවින් උක්ත චෝදනා යටතේ අත්අඩංගුවට ගනු ලැබුවේ නම් මෙම සිදුවීම සම්බන්ධයෙන් වැඩිදුර විමර්ශනයක් සිදුකිරීම කළ යුතුව තිබූ බව පෙනීයයි. එහෙත් මෙම සිදුවීමේදී වගඋත්තර නිලධාරීන් ක්‍රියාකර ඇති ආකාරය දෙස බැලීමේදී පෙනීයන්නේ මෙම නිලධාරීන් සිය බලය අවභාවිතා කරමින් කටයුතු කර ඇති බවයි.

විශේෂයෙන්, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහයේ 110 (1) වගන්තියෙහි, "..... යම් පොලිස් නිලධාරියෙකු විසින් හෝ පරීක්ෂකවරයෙකු විසින්, එම කාරණය පිළිබඳ සිද්ධි සහ අවස්ථාගත කරුණු දනිතැ යි සිතිය හැකි යම් තැනැත්තකුගෙන් වාචිකව විභාග කරනු ලැබිය හැකි අතර එසේ විභාග කරනු ලැබූ තැනැත්තා විසින් කරන ලද ඕනෑම ප්‍රකාශයක් ලියාගත යුතුය.... 109 (2) වන වගන්තියෙහි දක්වා ඇති ආකාරයට, ඒ මුළු ප්‍රකාශයම සම්පූර්ණයෙන් ම වාර්තාගත කළ යුතුය...." යනුවෙන් දක්වා ඇත. එකී නෛතික ප්‍රතිපාදන අනුව පොලිස් නිලධාරීන් විසින් අත්අඩංගුවට ගනු ලබන සැකකරුවෙකුගෙන් අත්තඅඩංගුවට ගැනීමට හේතු වූ වරද සම්බන්ධයෙන් ප්‍රකාශයක් සටහන් කර ගැනීම කළ යුතුය. එහෙත් මෙම පැමිණිල්ලේ අගතියටපත් පාර්ශවය වන ජී.ඒ. විශ්ව තරණ සඳගල යන අයගෙන් කිසිදු ප්‍රකාශයක් මට්ටක්කුලිය පොලිස් ස්ථානය විසින් සටහන් කරගෙන නොමැත. මෙම සැකකරු වයස අවුරුදු 19 ක් (අත්අඩංගුවට ගන්නා ලද අවස්ථාවේදී) තැනැත්තෙකු වන අතර, ඔහු අත්අඩංගුවට ගන්නා ලද අවස්ථාවේදී ඔහු සතුව කඩුවක් වැනි අන්තරාදායක ආයුධයක් තිබුණේ නම් සහ කිසියම් පුද්ගලයෙකුට මරණ තර්ජනය කිරීම, සංවිධානාත්මකව පිරිසක් සමග පැමිණ සිටීම යන කරුණු සම්බන්ධයෙන් ප්‍රකාශයක් සටහන් කර ගැනීම විමර්ශන නිලධාරියාගේ රාජකාරිය වේ. ඒ අනුව ජී.ඒ. විශ්ව තරණ සඳගල යන අය අත්අඩංගුවට ගැනීමේ ක්‍රියාවලිය තුළ නිසි විමර්ශනයක් සිදුවී නොමැති බවත් පොලිස් නිලධාරීන් සිය අභිමතය පරිදි අත්තනෝමතිකව කටයුතු කර ඇති බවත් මානව හිමිකම් කොමිෂන් සභාවට නිරීක්ෂණය වේ.

තවද, නිසි විමර්ශනයකින් පසුව අත්අඩංගුවට ගනු ලැබුවේ නම් සහ අත්අඩංගුවට ගත් පසු විමර්ශන කටයුතු නිසියාකාරව සිදුකරනු ලැබුවේ නම්, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහයේ 114

වගන්තියෙහි දක්වා ඇති පරිදි, "චූදිතයා මහේස්ත්‍රාත් අධිකරණයක් වෙත ඉදිරිපත් කරනු ලැබීම යුක්ති සහගත වීමට තරම් ප්‍රමාණවත් සාක්ෂි හෝ සැකයක් පිළිබඳ සාධාරණ හේතු ඇති බව මේ පරිච්ඡේදය යටතේ විමර්ශනයකින් පසු, පොලිස් ස්ථානය භාර නිලධාරියාට හෝ පරීක්ෂකවරයාට පෙනී ගිය හොත්...." යනාදී වශයෙන් පොලිස් නිලධාරීන් කටයුතු කළ යුතු ආකාරය සම්බන්ධයෙන් නීත්‍යානුකූල ප්‍රතිපාදන සඳහන් කර තිබියදී, මෙම වගඋත්තරකාර නිලධාරීන් මෙකී සිදුවීම තුළ එම ප්‍රතිපාදන කිසිවක් නොසලකා අත්තනෝමතික ආකාරයට කටයුතු කර ඇති බව නිරීක්ෂණය වේ. ඒ අනුව නිසි විමර්ශනයකින් තොරව අත්අඩංගුවට ගැනීම හා අන්තරාදායක ආයුධයක් සන්තකයේ තිබූ බවට ඉදිරිපත් කර ජී.ඒ. විශ්ව තරණ සඳගල යන අයට විරුද්ධව පවරන ලද නඩුව හේතුවෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තුන්වන පරිච්ඡේදයේ 12 (1) ව්‍යවස්ථාව මඟින් තහවුරු කර ඇති "නීතිය පසිඳලීම සහ ක්‍රියාත්මක කිරීම ද නීතියේ රැකවරණය ද සර්ව සාධාරණ විය යුත්තේය" යන මූලික අයිතිවාසිකම සහ 13 (1) වන ව්‍යවස්ථාව මඟින් සහතික කොට ඇති "නීතියේ නියම කරනු ලැබූ කාර්යය පටිපාටියට අනුකූලව මිස කිසිම තැනැත්තෙකු සිරභාරයට ගැනීම නොකළ යුතතේය" යන මූලික අයිතිවාසිකම වගඋත්තර පාර්ශවයන් විසින් උල්ලංඝනය කර ඇති බව සනාථ වේ.

තවද, සැකකරුගෙන් කිසිදු ප්‍රකාශයක් ලබානොගෙන, නිසි විමර්ශනයකින් තොරව මට්ටක්කුලිය පොලිස් ස්ථානයේ ස්ථානාධිපති ප්‍ර.පො.ප. නලින් චම්මික විජේවර්ධන නිලධාරියා විසින් 2025.06.20 දින ගරු අධිකරණයට කරුණු වාර්තා කරමින් ජී.ඒ. විශ්ව තරණ සඳගල යන අය, ල.ද.නි.ස. 449 වගන්තිය යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් කළ බවට සඳහන් කරමින්, 1979 අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ XIV වන පරිච්ඡේදයේ 136(1) (අ) වගන්තිය ප්‍රකාරව චෝදනා පත්‍රයක් යොමුකර ඇත. එකී චෝදනා පත්‍රයෙහි, "මරණ තර්ජනය කර සංවිධානාත්මකව පහරදීමට පැමිණීම සහ අන්තරාදායක වරදක් කළ හැකි ආයුධයක් ලඟ තබා ගැනීම" යන චෝදනා නිකුතර කර ඇත.

මෙකී සිදුවීම සිදු වූ 2024.12.02 දින මට්ටක්කුලිය පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයා වශයෙන් රාජකාරී කටයුතු සිදුකර ඇත්තේ ප්‍ර.පො.ප. ආර්.ඒ.ආර්.ඩී. කරුණාරත්න මහතා (පළමු වගඋත්තරකරු) වුවද, එම නිලධාරියා ස්ථානමාරුවීමෙන් පසු 2025.06.20 දින අධිකරණයට චෝදනා පත්‍රය ඉදිරිපත් කර ඇත්තේ ඒ වනවිට ස්ථානාධිපතිවරයා ලෙස කටයුතු කළ ප්‍ර.පො.ප. නලින් චම්මික විජේවර්ධන නිලධාරියා විසිනි. සැකකරුගෙන් ප්‍රකාශයක් සටහන් කර තිබේද නැද්ද යන්න සහ නිසි විමර්ශනයක් සිදුවී තිබේද නැද්ද යන්න සම්බන්ධයෙන් අධීක්ෂණයකින් තොරව, චෝදනා පත්‍රයක් ගොනු කිරීමට ස්ථානාධිපති ප්‍ර.පො.ප. නලින් චම්මික විජේවර්ධන නිලධාරියා කටයුතු කර ඇති අතර, මුල් සිද්ධියට සම්බන්ධ වගඋත්තරකාර නිලධාරීන්ගේ දෝෂ සහිත විමර්ශන වාර්තා කිසිදු පරීක්ෂාවකින් තොරව අධිකරණයට ඉදිරිපත් කිරීම තුළින් ස්ථානාධිපති ප්‍ර.පො.ප. නලින් චම්මික විජේවර්ධන මහතා අධීක්ෂණභාර නිලධාරියා වශයෙන් සිය රාජකාරී කටයුතු නිසි පටිපාටියකින් තොරව සිදුකර ඇති බව නිරීක්ෂණය වේ.

මෙම පැමිණිල්ලේ දෙවන චෝදනාව ලෙස, පැමිණිලිකරු වන ජී.එන්.එන්. සඳගල යන අයට සහ ජී.ඒ. විශ්ව තරණ සඳගල යන අයට පොලිස් නිලධාරීන් විසින් පහරදුන් බව සඳහන් කර ඇත. එකී

චෝදනාව පිළිබඳව මානව හිමිකම් කොමිෂන් සභාව විසින් සිදුකරන ලද විමර්ශනය තුළින් පහත කරුණු අනාවරණයවී ඇත.

දෙවන වගඋත්තරකරුවන පො. සැ. 53137 වී. එම්. ආනන්ද ගුණසේකර නිලධාරියා විසින් මට්ටක්කුලිය පොලිස් ස්ථානයේ ගමන් සටහන් තොරතුරු සටහන් පොතේ 104/42 යටතේ, ".......පො. කො. රි. 80765 එම්. එච්. ජේ. සකලසූරිය නිලධාරියාගේ පපුවට අතින් පහරදී පරුෂ වචනයෙන් බැන වැදී අත දිගහැර පහරක් ගැසීමේදී නිලධාරියා බිම වැටී ගිය අතර........එම අවස්ථාවේදී මා පොලිස් ස්ථානයෙන් පැමිණි නිලධාරීන් සමග අවම බලය පාවිච්චි කළෙමි. මෙම අවස්ථාවේදී පොර බැදීම නිසා පිට ප්‍රදේශයේ තැලීම් සීරීම් ඇත......" යනුවනේ සඳහන් කර ඇත.

එම නිලධාරියා විසින් කොමිෂන් සභාවට ලබාදෙන ලද ප්‍රකාශයෙහි සඳහන් කර ඇත්තේ, "........ එම අවස්ථාවේදී ආකාශ් විශ්ව තරණ යන අය පො. කො. රි. 80765 එම්. එච්. ජේ. සකලසූරිය නිලධාරියාගේ නිල ඇඳුමේ කොලරයෙන් අල්ලා පිටුපස්සට තල්ලු කළ බවත්, එම අවස්ථාවේදි එම ළමයා සහ නිලධාරියා අතර පොරබැදීමක් සිදු වූ බවත්, පොර බැදිමේදි දෙදෙනාම බිම වැටුණු බවත්....... තමා සිදු කලේ සැකකරු අත්අඩංගුවට ගෙන ස්ථානයට ඉදිරිපත් කිරිම පමණක් බවත් තමා හෝ තමාගේ නිලධාරින් විසින් කිසිදු පහර දිමක් සිදු නොකළ බවත්......" යනුවෙනි. එහෙත් කොමිෂන් සභාව වෙත ලබාදෙන ලද ප්රකාශයෙහි ජී. ඒ. විශ්ව තරණ සඳගල යන අය පො. කො. රි. 80765 එම්. එච්. ජේ. සකලසූරිය නිලධාරියාගේ නිල ඇඳුමේ කොලරයෙන් අල්ලා පිටුපස්සට තල්ලු කළා යන්න මිස, අත දිගහැර පහරක් ගැසූ බව හෝ එම පහරින් නිලධාරියා බිම වැටුණු බව හෝ ප්‍රකාශ කර නොමැත.

එමෙන්ම තුන්වන වගඋත්තරකරු වන පො. කො. රි. 80765 එම්. එච්. ජේ. සකලසූරිය නිලධාරියා කොමිෂන් සභාවට ලබාදෙන ලද ප්‍රකාශයෙහි සඳහන් කර ඇත්තේ, ".....ආකාශ් විශ්ව තරණ යන අය සමග බෑගය ලබා ගැනිමට පොර බැදූ බවත්, බෑගය මතුපිටින් අල්ලා බලනවිට එය තුළ යකඩයක් වැනි දෙයක් තිබෙන බව තමාට තේරුම් ගිය බවත්.........පැමිණිල්ලේ සඳහන් පරිදි කිසිදු පහරදිමක් තමන් සිදු නොකළ බවත්, ආයුධය ලබා ගැනිම සඳහා පොර බැදිමක් පමණක් තමන් සිදු කළ බවත්, ඒ අවස්ථාවේ බිමට වැටුණට, බිම පෙරලමින් පොර බැදිමක් සිදු නොකළ බවත්, පොරබැදීමේදී තැලීම් සිරීම් සිදුවෙන්න ඇති බවත්, තමාට ද පොඩි සිරීම් තැලීම් තිබූ බවත් බෙහෙත් ගැනීමට තරම් බරපතල තත්වයක් නොතිබූ බවත්....." යනුවෙනි. එම නිලධාරියාගේ ප්‍රකාශයෙහි ජී. ඒ. විශ්ව තරණ සඳගල යන අය විසින් ඔහුගේ නිල ඇඳුමේ කොලරයෙන් අල්ලා පිටුපස්සට තල්ලු කළ බව හෝ සැකකරු විසින් ඔහුට අත දිගහැර පහරක් එල්ල කළ බව හෝ සඳහන් කර නොමැත. ඒ අනුව ජී. ඒ. විශ්ව තරණ සඳගල යන අය අත්අඩංගුවට ගැනීමට සම්බන්ධ වූ නිලධාරීන් දෙදෙනා විසින් සැකකරු අත්අඩංගුවට ගැනීමේදී සිදුවූ සිදුවීම සම්බන්ධයෙන් කොමිෂන් සභාවට ලබාදී ඇති ප්‍රකාශ අතර පරස්පරතා පවතින බව නිරීක්ෂණය වේ. එබැවින් මෙම නිලධාරීන් ප්‍රකාශ කරනු ලබන විෂය ගත සිදුවීම, සත්‍ය සිදුවීමක් ද යන්න ගැටලු සහගත වේ.

ඉහත ප්‍රකාශයන්ට පරස්පර විරෝධී ප්‍රකාශයක් ලබාදෙන ජී. ඒ. විශ්ව තරණ සඳගල යන අය සඳහන් කර ඇත්තේ, දෙවන හා තෙවන වගඋත්තරකරුවන් සහ ඉන්ධනහල අසලට පැමිණි අනෙක් නිලධාරීන් විසින් ඔහුට අමානුෂික ආකාරයට පහරදී ජීප් රථයට නංවාගෙන, ජීප් රථය තුළදී ද පහරදුන් බවයි. දෙවන වගඋත්තරකරු විසින් සටහන් කර ඇති පරිදි, ජී. ඒ. විශ්ව තරණ සඳගල යන අයගේ පිට ප්‍රදේශයේ තුවාල තිබූ බවට 2024.12.07 දින අධිකරණ වෛද්‍ය වරයා විසින් නිකුත් කරන ලද අධිකරණ වෛද්‍ය වාර්තාවෙහි සඳහන් නොවේ.

තවද, 2024.12.02 දින මට්ටක්කුලිය පොලිස් ස්ථානයේ උපසේවා රාජකාරීවල නිරත වූ හයවන වගඋත්තරකරු වන පො. කො. 24052 ආර්. ආර්. රාජපක්ෂ නිලධාරියා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ලබාදෙන ලද ප්‍රකාශයෙහි, ".......විශ්ව තරණ යන අය පැය 18.15 ට උපසේවය වෙත භාර දුන් බවත්, ...උපසේවයට භාරගන්නා අවස්ථාවේදී එම සැකකරුට පොලිස් නිලධාරීන් විසින් පහර දුන් බව ඔහු තමාට කියා සිටි බවත්, එහෙත් උපසේවා රාජකාරියේ යෙදී සිටින නිලධාරියා විසින් සටහන් කර ගනු ලබන්නේ උපසේවයට භාර දෙන අවස්ථාවේදි සැකකරුගේ බාහිරින් පෙනිමට ඇති තුවාල සම්බන්ධයෙන් පමණක් වන බැවින් සැකකරු ප්‍රකාශ කළ බාහිර කරුණු සටහන් නොකළ බවත්......" වශයෙන් සඳහන් කර ඇත. එකී ප්‍රකාශය අනුව ජී.ඒ. විශ්ව තරණ සඳගල යන විසින් උපසේවා භාර නිලධාරියා වෙත තමාට පොලිස් නිලධාරීන් විසින් පහරදුන් බව ප්‍රකාශ කර ඇති අතර, එම නිලධාරියා විසින් එම කරුණු සඳහන් කර නොමැති අතර, ස්ථානාධිපතිවරයා දැනුවත් කිරීමක් ද සිදුකර නොමැත. හයවන වගඋත්තරකරු වන පො.කො. 24052 ආර්.ආර්. රාජපක්ෂ නිලධාරියා මෙම සිදුවීමේදී ක්‍රියාකර ඇති ආකාරය අනුව, එම නිලධාරියා සිය රාජකාරී වගකීම් නිසි ලෙස ඉටු කර නොමැති බව නිරීක්ෂණය වේ.

තවද, ජී.ඒ. විශ්ව තරණ සඳගල යන අය දෙවන හා තෙවන වගඋත්තරකාර නිලධාරීන් විසින් අත්අඩංගුවට ගනු ලබන්නේ පැය 16.30 වන අතර උපසේවය වෙත භාරදී තිබෙන්නේ පැය 18.15 වේ. එම කාල පරාසය තුළ සැකකරුගෙන් කිසිදු ප්‍රකාශයක් සටහන් කර ගැනීමක් සිදුකර නොමැති නම් උපසේවය වෙත සැකකරු භාරදීමට ප්‍රමාදවීමට හේතුව කුමක්ද යන්න ගැටලු සහගත වේ. දෙවන වගඋත්තරකරුවන පො.සැ. 53137 වී.එම්. ආනන්ද ගුණසේකර නිලධාරියා විසින් මට්ටක්කුලිය පොලිස් ස්ථානයේ ගමන් සටහන් තොරතුරු සටහන් පොතේ 104/42 යටතේ, "........ එම අවස්ථාවේදී මා පොලිස් ස්ථානයෙන් පැමිණි නිලධාරීන් සමග අවම බලය පාවිච්චි කළෙමි. මෙම අවස්ථාවේදී පොර බැදීම නිසා පිට ප්‍රදේශයේ තැලීම් සීරීම් ඇත..." යනුවෙන් සඳහන් කර ඇත්තේ ඉන්ධනහල අසලදී අත්අඩංගුවට ගන්නා අවස්ථාවේදී සැකකරුගේ බාහිරින් පෙනීමට තිබූ තුවාල පිළිබඳ වේ. එහෙත් පැය 16.30 අත්අඩංගුවට ගෙන පැය 18.15 ට උපසේවය වෙත භාරදෙන අවස්ථාවේදී, උපසේවා රාජකාරියේ නිරතව සිටි හයවන වගඋත්තරකරු වන පො. කො. 24052 ආර්. ආර්. රාජපක්ෂ නිලධාරියා විසින්, 104/42 යටතේ, "ඉහත පරිදි පො. සැ. 53137 වී. එම්. ආනන්ද ගුණසේකර නිලධාරියා විසින් භාර දෙන ලද සැකකරු වන ගලගෙදර ආකාශ් විශ්ව තරණ සඳගල හා නඩු බඩු..........සැකකරු පරීක්ෂා කර බැලූ අතර ඔහුගේ පිටෙහි උඩ කොටසෙහි තැලුම් කැලැල් හා සීරීම් කැලැල් දක්නට ඇත. දකුණු අතෙහි වැලිමිටට උඩින් තැලීම් තුවාලයක් ඇත. වෙනත් පිටතින්

පෙනීමට කිසිදු සිදුවීමක් නොමැත.......” යනුවෙන් සටහන් කර ඇත. එකී සටහන අනුව නිරීක්ෂණය වන්නේ, දෙවන වගඋත්තරකරුවන පො. සැ. 53137 වී.එම්. ආනන්ද ගුණසේකර නිලධාරියා අත්අඩංගුවට ගන්නා විට, පිට ප්‍රදේශයේ තැලීම් සීරීම් පමණක් දැක ගැනීමට තිබූ බවත්, පැයකට වැඩි කාලයකට පසු උපසේවයට භාර ගන්නා විට, පිටෙහි උඩ කොටසෙහි තැලුම් කැලැල් හා සීරීම් කැලැල් සමඟ දකුණු අතෙහි වැලිමිටට උඩින් තැලීම් තුවාලයක් ද තිබී ඇති බවයි. මෙම සාධක අනුව ජී. ඒ. විශ්ව තරණ සඳගල යන අය ප්‍රකාශ කරන ආකාරයට පොලිස් ස්ථානය තුළදී ද පහරදීමක් සිදුවී ඇති බව පෙනීයයි.

තවද, පැමිණිලිකරු වන ජී.එන්.එන්. සඳගල යන අය සහ ජී. ඒ. විශ්ව තරණ සඳගල යන අය 2024.12.02 දින අත්අඩංගුවට ගත් පසු අධිකරණයට ඉදිරිපත් කිරීමට පෙර 2024.12.03 වන දින ජාතික රෝහලේ අධිකරණ වෛද්‍ය නිලධාරීවරයෙකු වෙත යොමුකර ඇති අතර, වෛද්‍යවරයා විසින් ඔවුන් පරීක්ෂා කිරීමෙන් අනතුරුව නිකුත් කරන ලද අධිකරණ වෛද්‍ය වාර්තාවෙහි, ජී.එන්.එන්. සඳගල යන අයට කායික තුවාලයක් නිරීක්ෂණය නොවන බවත්, ජී. ඒ. විශ්ව තරණ සඳගල යන අයගේ කායික තැලීම් තුවාල 05 ක් දැක ගැනීමට ඇති බව සටහන් කර තිබේ.

නැවත වරක් ජී. ඒ. විශ්ව තරණ සඳගල යන අය 2024.12.05 දින අධිකරණයෙන් ඇප ලබාගත් පසු 2024.12.07 වන දින ජාතික රෝහලට ඇතුළත්වී ඇති අතර, එහිදී 2024.12.03 දින ඔහුව පරීක්ෂා කරන ලද ජාතික රෝහලේ අධිකරණ වෛද්‍යවරයා විසින්ම 2024.12.07 වන දින ද ඔහුව පරීක්ෂා කර ඇති අතර, එදින නිකුත් කරන ලද අධිකරණ වෛද්‍ය වාර්තාවෙහි, ජී. ඒ. විශ්ව තරණ සඳගල යන අයගේ කායික තැලීම් තුවාල 03 ක් පවතින බව සඳහන් කර ඇත.

ඒ අනුව පොලිස් නිලධාරීන් විසින් ජී. ඒ. විශ්ව තරණ සඳගල යන අය අත්අඩංගුවට ගන්නා අවස්ථාවේදී සහ පොලිස් ස්ථානය තුළදී තමාට පහර දුන් බවට කරන ලද ප්‍රකාශයත්, ඔහුගේ මව විසින් පොලිස් නිලධාරීන් විසින් සිය පුත්‍රයාට පහරදුන් බවට ලබාදී ඇති ඇසින් දුටු සාක්ෂියත්, 2024.12.03 සහ 2024.12.07 යන දින දෙකෙහිම අධිකරණ වෛද්‍යවරයා විසින් පරීක්ෂා කිරීමෙන් අනතුරුව නිකුත් කරන ලද අධිකරණ වෛද්‍ය වාර්තා දෙකෙහි සඳහන් තොරතුරු විමර්ශනය කිරීමේදී, ජී. ඒ. විශ්ව තරණ සඳගල යන අයට පොලිස් නිලධාරීන් විසින් පහරදී ඇති බව සනාථ වේ.

ඉහත සියලුම කරුණු විමර්ශනය කර බැලීමේදී, නීතිය හා සාමය ආරක්ෂා කරනු ලබන නිලධාරීන් විසින් මෙම සිදුවීමේදී ක්‍රියාකර ඇති අත්තනෝමතික ක්‍රියාපටිපාටිය නිරීක්ෂණය කිරීමේදී වගඋත්තරකාර නිලධාරීන් විසින් පොලිස් නිලධාරීන් බාරයේ සිටි ජී. ඒ. විශ්ව තරණ සඳගල යන අය සම්බන්ධයෙන්, “කිසිදු තැනැත්තෙකු වධහිංසාවකට හෝ කෲර අමානුෂික හෝ අවමන් සහගත සැලකිල්ලකට නැතහොත් දඬුවමකට යටත් නොකළ යුත්තේය” යන මූලික අයිතිවාසිකම උල්ලංඝනය කරමින් කටයුතු කර ඇති බව සනාථ වේ.

පැමිණිලි පාර්ශවය ඉදිරිපත් කරනු ලබන තෙවන චෝදනාව වන්නේ, ජී. ඒ. විශ්ව තරණ සඳගල යන අයගේ පියා වන ජී.එන්.එන්. සඳගල යන අය, පොලිස් ස්ථානය තුළදී සිය පුත්‍රයාගේ ඡායාරූපයක් ගැනීමට උත්සාහ කිරීමේදී පොලිස් නිලධාරීන් ඔහුට පහර දී දුරකථනය උදුරාගෙන, "සාපරාධී බලහත්කාරය පාමින් රාජ්‍ය ආයතනයකට පැමිණ රාජකාරි නිලධාරීන්ට අඩත්තේට්ටම් කිරීම" යන සාවද්‍ය චෝදනා ගොනු කර අත්අඩංගුවට ගත් බවයි. එකී චෝදනාව සම්බන්ධයෙන් විමර්ශනය කිරීමේදී අනාවරණය වූ කරුණු පහත පරිදි වේ.

ජී.එන්.එන්. සඳගල යන අය අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන්, පළමුවන වගඋත්තරකරු වන ප්‍ර.පො.ප. ආර්.ඒ.ආර්.ඩී. කරුණාරත්න මයා (හිටපු ස්ථානාධිපති, මට්ටක්කුලිය පොලිස් ස්ථානය) ප්‍රකාශ කර ඇත්තේ, "........සැකකරු රැගෙන ආ පසු සැකකරුගේ පියා වන ජී.එන්.එන්.සඳගල යන අය පැමිණ සිය පුත්‍රයා අත්අඩංගුවට ගැනිම සම්බන්ධයෙන් කලහාකාරි ලෙස චෝදනාගාරය තුළ හැසිරි ඇති බවත්, එදින තමා මාර්ගගත ක්‍රමයට සාකච්ඡාවකට සම්බන්ධවී සිටි බැවින් මෙම සිදුවීම සම්බන්ධයෙන් එදින උපසේවයේ සිටි පො.කො. 24052 රාජපක්ෂ නිලධාරියා විසින් තමාව දැනුවත් කල බවත්, එම අවස්ථාවේදී මෙම පුද්ගලයා විසින් උපසේවක නිලධාරියාව තල්ලු කර ඇති අතර චෝදනාගාරය වීඩියෝ ගත කිරිමට උත්සහ කර ඇති බවත්, ... උපසේවක නිලධාරියා විසින් මෙම සිදුවීම පිළිබඳව තමා දැනුවත් කළ පසු ජී.එන්.එන්. සඳගල යන අයව තමාගේ රාජකාරි කාමරයට කැඳවා විමසිමක් සිදු කළ බවත්, එම අවස්ථාවේදි සිය පුත්‍රයා අත්අඩංගුවට ගැනිමට හේතු විමසා සිටි අතර ඔහු සන්තකයේ අන්තරාදායක ආයුධයක් වන කඩුවක් තබා ගෙන සිටිම හේතුවෙන් අත්අඩංගුවට ගැනිම සිදු කර ඇති බවට තමා විසින් ජී.එන්.එන්. සඳගල යන අයට පැහැදිලි කළ බවත්, ජී.එන්.එන්. සඳගල යන අය මානව හිමිකම් ආයතනයේ වැඩ කරන බවට තමාහට ද ප්‍රකාශ කළ බවත්, තමා විසින් එම ආයතනයේ හැඳුනුම්පතක් තිබේනම් ලබා දෙන ලෙස ප්‍රකාශ කළමුත් හැඳුනුම්පතක් තමා වෙත ලබානොදුන් බවත්, අනතුරුව තමා උපසේවක වෙත මෙම පුද්ගලයා ප්‍රකාශ කරන දේ පිළිබඳව සොයාබලා සටහන් යොදන ලෙස දැනුම්දුන් බවත්, පසුව 'සාපරාධි බලහත්කාරය පාමින් රාජ්‍ය ආයතනයකට පැමිණ රාජකාරියේ නියුතු නිලධාරින්ට අඩත්තෙට්ටම් සිදු කිරිම සම්බන්ධයෙන්' වරදකියාදී එම පුද්ගලයාව අත්අඩංගුවට ගන්නා ලෙස තමා විසින් එදින කාර්ය භාර රාජකාරියේ යෙදි සිටි පො.සැ. 74791 විජේසිංහ නිලධාරියාට උපදෙස් ලබාදුන් බවත්........" වශයෙනි.

ජී.එන්.එන්. සඳගල යන යන අය චෝදනාගාරය තුළ කලහකාරී ලෙස හැසිරුණු බව සඳහන් වන අවස්ථාවේදී ස්ථානාධිපති ප්‍ර.පො.ප. ආර්.ඒ.ආර්.ඩී. කරුණාරත්න නිලධාරියා මාර්ගගත සාකච්ඡාවක නිරතව සිට ඇති බව පෙනීයන අතර, එකී රාජකාරී කටයුතු අවසන් වූ පසු පොලිස් ස්ථානයේ අධීක්ෂණ නිලධාරියා වශයෙන් චෝදනාගාරය තුළ සිදුවූ සිදුවීම සම්බන්ධයෙන් පසු විපරමක් සිදුකර හෝ එම අවස්ථාවේ චෝදනාගාරය තුළ සිටි නිලධාරීන් වෙතින් විමසීමක් සිදුකර හෝ නොමැති බව නිරීක්ෂණ වේ.

තවද, පැමිණිලිකරුවන ජී.එන්.එන්.සඳගල යන අය ස්ථානාධිපතිවරයාගෙන් සිය පුත්‍රයා අත්අඩංගුවට ගැනීමට හේතු විමසීමේදී, පුත්‍රයා අත්අඩංගුවට ගැනීමට පෙර එදිනම පුත්‍රයාට විරුද්ධව පොලිස්

ස්ථානයට පැමිණිල්ලක් ලැබී තිබූ බව හෝ එකී පැමිණිල්ල සම්බන්ධයෙන් විමර්ශනයක් සිදු කළ බව හෝ ස්ථානාධිපතිවරයා විසින් ජී.එන්.එන්.සඳගල යන අයව දැනුවත් කර නොමැති බව පෙනීයයි. තවද, එදින පොලිස් ස්ථානයේ කාර්යභාර නිලධාරියා ලෙස එකී පැමිණිල්ල භාරගෙන සටහන් කරන ලද නිලධාරියා වූ, හයවන වගඋත්තරකරුවන පො.සැ. 74719 ඩබ්.එම්.ආර්.එල්. විජේසිංහ නිලධාරියා විසින් හෝ (ජී.එන්.එන්.සඳගල යන අය අත්අඩංගුවට ගනු ලැබූ නිලධාරියා) එවැනි පැමිණිල්ලක් ලැබී තිබූ බවට දැනුවත් කිරීමක් කර නොමැති බව නිරීක්ෂණය වේ.

ජී.එන්.එන්. සඳගල යන අය අත්අඩංගුට ගන්නා අවස්ථාවේදී චෝදනාගාරය තුළ සිටි පස්වන වගඋත්තරකරු වන කා. පො. සැ. 3429 ටී. එම්. ඉනෝකා සුභාසිස් නිලධාරිනිය ප්‍රකාශ කර ඇත්තේ, "....... තමා විවේකය වාර්තා කිරීමට චෝදනාගාරයට යන අවස්ථාවේදි කඩුවක් සමග අත්අඩංගුවට ගත් ජී. ඒ. විශ්ව තරණ සඳගල යන දරුවා චෝදනාගාරය තුළ තිබෙන යකඩ බංකුවේ වාඩි කරවා සිටිනු දුටු බවත්, ඒ අවස්ථාවේ ඒ අසල එම දරුවාගේ මව සහ තවත් කීප දෙනෙක් දරුවා සමග කතා කරමින් සිටිනු දුටු බවත්, තමා විවේකය වාර්තා කර නැවත තමාගේ කාර්යාලයට ගොස් පැමිණෙන අවස්ථාවේදී ජී. ඒ. විශ්ව තරණ සඳගල යන අයගේ පියා වන ජී.එන්.එන්. සඳගල යන අය ඔහුගේ ජංගම දුරකථනයෙන් චෝදනාගාරය වීඩියෝ ගත කරනවා තමා දුටු බවත්, එවිට තමා ජී.එන්.එන්. සඳගල යන අයට පොලිස් ස්ථානය තුළ වීඩියෝ කිරීම නොකරන ලෙස දැනුම්දුන් බවත්, එවිට එම තැනැත්තා "මගේ පුතාව මම වීඩියෝ කරන්නේ" යනුවෙන් ප්‍රකාශ කළ බවත්, එහෙත් තමා නැවත වරක් පොලිස් ස්ථානය තුළ වීඩියෝ නොකරන ලෙස දැනුම්දුන් නමුත් එම තැනැත්තා තමා කී දේවල් ගණනකට නොගෙන ඔහුගේ පුතා වාඩිකර සිටි බංකුව හා ඒ අවට ප්‍රදේශය වීඩියෝ ගත කරන අවස්ථාවේදි තමා විසින් ඔහු අල්ලා සිටි ජංගම දුරකථනයේ කැමරාව වැහෙන ආකාරයට තමාගේ අත්ල තැබූ බවත්, තමා එසේ සිදුකරනු ලැබුවේ පොලිස් ස්ථානයේ අවි ගබඩාව හා සිර මැදිරිය ඒ ආසන්නයේ පිහිටා තිබූ බැවින් බවත්, මෙම සිදුවීම වන අවස්ථාවේදී එම ස්ථානයේ රැඳී සිටි උපසේවක නිලධාරියා සහ පො.සැ. 74719 ඩබ්. එම්. ආර්. එල්. විජේසිංහ නිලධාරියා එම ස්ථානයට පැමිණ මෙම ජී.එන්.එන්. සඳගල යන අය දුරකථනයෙන් වීඩියෝ ගත කරන ක්‍රියාව නතර කර දැමීමට කටයුතු කළ බවත්, එම අවස්ථාවේ එම පුද්ගලයා ඉතා ආවේගශීලීව හැසිරුණු බවත්......." යනුවෙනි.

මෙම සිදුවීම සම්බන්ධයෙන් හයවන වගඋත්තරකරු වන පො. කො. 24052 ආර්. ආර්. රාජපක්ෂ නිලධාරියා ප්‍රකාශ කර ඇත්තේ, "2024.12.02 දින තමා පොලිස් ස්ථානයේ උපසේවා රාජකාරි වල යෙදි සිටි බවත්......... තමා උපසේවා ස්ථානය වෙත පැමිණෙන විට ඉහත සැකකරුගේ පියා යැයි කියන ජී.එන්.එන්. සඳගල යන අය විසින් බංකුවේ වාඩිවී සිටි සැකකරු ඡායාරූප ගත කිරිමට උත්සහ කරන අවස්ථාවේ කා.පො.සැ. 3429 ඉනෝකා නිලධාරිනිය පැමිණ ඔහු අතේ තිබූ දුරකථනය ලබාගත් බවත්, එම නිලධාරිනිය විසින් ස්ථානය ඇතුළත ඡායාරූප ගන්නේ කොහොමද කියලා එම පුද්ගලයාගෙන් විමසා සිටි බවත්........ එවිට එම පුද්ගලයා විසින් තමා මානව හිමිකම් ආයතනයේ යැයි ප්‍රකාශ කරමින් තමාගේ පුතාට පොලිසියෙන් පහර දි ඇති බවත්, හොද වැඩක් කරන්නම් කියලා කෑගැසූ බවත් එවිට තමා විසින් ඔහුට මෙතන කෑ ගහන්න එපා යැයි ප්‍රකාශ කළ බවත් එවිට ඔහු

විසින් තමාව තල්ලු කළ බවත්.... පසුව, එදින පොලිස් ස්ථානයේ කාර්යභාර නිලධාරියා ලෙස රාජකාරී කළ පො.සැ. 74719 ඩබ්. එම්. ආර්. එල්. විජේසිංහ නිලධාරියා එම ස්ථානයට පැමිණ 'රාජ්‍ය නිලධාරින්ට අඩත්තේට්ටම් කිරීම හා සාපරාධි බලහත්කාරයපෑම' යන වරද කියාදී සැකකාර ජී.එන්.එන්. සඳගල යන පුද්ගලයා අත්අඩංගුවට ගත් බවත්, ඉන්පසු එම නිලධාරියා විසින් සඳගල යන අය උපසේවයට භාරදුන් බවත්......" යනුවෙනි.

හයවන වගඋත්තරකරුගේ ප්‍රකාශය හා පස්වන වගඋත්තරකාර නිලධාරිනියගේ ප්‍රකාශය විමර්ශනය කිරීමේදී පරස්පරතා කිහිපයක් නිරීක්ෂණය වේ. එනම්, පස්වන වගඋත්තරකරු වන කා. පො. සැ. 3429 ටී. එම්. ඉනෝකා සුභාරිස් නිලධාරිනිය ප්‍රකාශ කර ඇත්තේ, "නිලධාරිනිය විසින් සැකකාර ජී.එන්.එන්. සඳගල යන අය ඔහුගේ ජංගම දුරකථනයෙන් චෝදනාගාරය වීඩියෝ ගත කරනවා දුටු අවස්ථාවේදී පොලිස් ස්ථානය තුළ වීඩියෝ කිරීම නොකරන ලෙස දැනුම්දුන් බවත්, එම ක්‍රියාව නතර නොකළ බැවින් තමා නැවත වරක් පොලිස් ස්ථානය වීඩියෝ නොකරන ලෙස දැනුම්දුන් නමුත් එම තැනැත්තා තමා කී දේවල් ගණනකට නොගෙන ඔහුගේ පුතා වාඩිකර සිටි බංකුව හා ඒ අවට ප්‍රදේශය වීඩියෝ ගත කරන අවස්ථාවේදි තමා විසින් ඔහු අල්ලා සිටි ජංගම දුරකථනයේ කැමරාව වැහෙන ආකාරයට තමාගේ අත්ල තැබූ බවයි." එහෙත් මෙම සිදුවීම සිදුවන අවස්ථාවේදී එම ස්ථානයේ සිටි හයවන වගඋත්තරකරු වන පො. කො. 24052 ආර්. ආර්. රාජපක්ෂ නිලධාරියා ප්‍රකාශ කර ඇත්තේ, "ජී.එන්.එන්. සඳගල යන අය විසින් බංකුවේ වාඩිවී සිටි සැකකරු ඡායාරූප ගත කිරීමට උත්සහ කරන අවස්ථාවේ කා.පො.සැ. 3429 ඉනෝකා නිලධාරිනිය පැමිණ ඔහු අතේ තිබු දුරකථනය ලබාගත් බවත්, එම නිලධාරිනිය විසින් ස්ථානය ඇතුළත ඡායාරූප ගන්නේ කොහොමද කියලා එම පුද්ගලයාගෙන් විමසා සිටි බවත්" ය. පැමිණිලිකාර ජී.එන්.එන්. සඳගල යන අය ද ප්‍රකාශ කර ඇත්තේ, "........ තමා විසින් තමාගේ දුරකථනය ගෙන පුතාට පහරදී තිබූ ආකාරය ඡායාරූපයක් ගැනීමට උත්සාහ කළ බවත්, එවිට එම ස්ථානයේ සිටි කාන්තා පොලිස් නිලධාරිනිය ඇතුලු අනෙකුත් නිලධාරින් "මෙන්න මූ පුතාගේ ෆෝටෝ එකක් ගත්තා" යැයි පවසා, තමාට පහරදී තමාගේ අතේ තිබූ දුරකථනය උදුරාගෙන, නිලධාරීන්ගේ රාජකාරියට බාධා කළ බවට ව්‍යාජ චෝදනා ගොනුකර තමාව සිර මැදිරියට දැමූ බවත්....." වශයෙනි. ඒ අනුව පස්වන වගඋත්තරකරු වන කා. පො. සැ. 3429 ටී. එම්. ඉනෝකා සුභාරිස් නිලධාරිනිය විසින් ජී.එන්.එන්. සඳගල යන අය අතේ තිබූ ජංගම දුරකතනය ලබාගෙන ඇති බව පෙනීයයි. එහෙත් එම නිලධාරිනිය විසින් කොමිෂන් සභාව වෙත සත්‍ය කරුණු සඟවා ප්‍රකාශ කර ඇති බව හයවන වගඋත්තරකරුගේ ප්‍රකාශය තුළින් අනාවරණය වේ.

ජී.එන්.එන්. සඳගල යන අය අත්අඩංගුවට ගනු ලැබූ හත්වන වගඋත්තරකරු වන පො. සැ. 74791 ඩබ්. එම්. ආර්. එල්. විජේසිංහ නිලධාරියා ප්‍රකාශය තුළ, ".......කා.පො.සැ. 3429 ඉනෝකා නිලධාරිනිය විසින් වීඩියෝ ගත කිරීම සිදු නොකරන ලෙස එම පුද්ගලයාට ප්‍රකාශ කළ බවත්, එය පිළිනොගෙන දිගටම වීඩියෝ ගත කිරීම සිදු කළ බවත්, ඔහු විසින් උපසේවයේ සිටි පො.සැ. 24052 රාජපක්ෂ නිලධාරියාව තල්ලු කරනු ලැබූ බවත්........" යනුවෙන් සඳහන් කර ඇත. එම ප්‍රකාශය අනුව ජී.එන්.එන්. සඳගල යන අය විසින් උපසේවයේ සිටි පො.සැ. 24052 රාජපක්ෂ නිලධාරියාව තල්ලු කළ බව හත්වන වගඋත්තරකරු විසින් සඳහන් කර තිබුණ ද, කා.පො.සැ. 3429 ඉනෝකා

නිලධාරිනිය විසින් සැකකරු අතේ තිබූ ජංගම දුරකථනය ලබාගත් බව පිළිබඳව සඳහන් කර නොමැත. තවද, ඉහත ප්‍රකාශයෙහි ජී.එන්.එන්. සඳගල යන අය විසින් පො. කො. 24052 ආර්. ආර්. රාජපක්ෂ නිලධාරියාව තල්ලු කරනු ලැබූ බව හත්වන වගඋත්තරකරු ප්‍රකාශ කර ඇති නමුත්, මෙම සිදුවීම වන අවස්ථාවේ එම ස්ථානයේ සිටි පස්වන වගඋත්තරකරු වන කා. පො. සැ. 3429 ටී. එම්. ඉනෝකා සුභාරිස් නිලධාරිනියගේ ප්‍රකාශයෙහි එවැනි සිදුවීමක් සඳහන් කර නොමැත.

ඒ අනුව ඉහත පස්වන, හයවන සහ හත්වන වගඋත්තරකාර නිලධාරීන් ලබාදී ඇති ප්‍රකාශයන්හි දැකගත හැකි පස්පරතාවයන් හේතුවෙන් චෝදනාගාරය තුළ සිදුවූ සිදුවීම සම්බන්ධයෙන් වගඋත්තර පාර්ශවයන් ලබාදී ඇති ප්‍රකාශවල සත්‍යතාවය පිළිබඳව ගැටලුකාරී ස්වභාවයක් මතු වේ. මෙම සිදුවීම වන අවස්ථාවේදී පැමිණිලිකරුවන ජී.එන්.එන්. සඳගල යන අයගේ බිරිඳ වන ඩී. ඒ. විශාකා නිල්මිනී යන අය චෝදනාගාරය තුළ සිට ඇති බව පස්වන වගඋත්තරකරු වන කා. පො. සැ. 3429 ටී. එම්. ඉනෝකා සුභාරිස් නිලධාරිනියගේ ප්‍රකාශය අනුව නිරීක්ෂණය වේ. එකී ප්‍රකාශයෙහි, "....... තමා විවේකය වාර්තා කිරීමට චෝදනාගාරයට යන අවස්ථාවේදි කඩුවක් සමග අත්අඩංගුවට ගත් ජී. ඒ. විශ්ව තරණ සඳගල යන දරුවා චෝදනාගාරය තුළ තිබෙන යකඩ බංකුවේ වාඩි කරවා සිටිනු දුටු බවත්, ඒ අවස්ථාවේ ඒ අසල එම දරුවාගේ මව සහ තවත් කීප දෙනෙක් දරුවා සමග කතා කරමින් සිටිනු දුටු බවත්....." යනුවෙන් සඳහන් කර ඇත. මෙම සිදුවීමෙහි ඇසින්දුටු සාක්ෂිකාරිනියක් ලෙස ජී.එන්.එන්. සඳගල යන අයගේ බිරිඳ වන ඩී. ඒ. විශාකා නිල්මිනී යන අය විසින් 2025.03.17 දිනැතිව දිව්රුම් ප්‍රකාශයක් කොමිෂන් සභාවට යොමුකර ඇති අතර, එම දිව්රුම් ප්‍රකාශය අනුව, ".... මාගේ සැමියා පුතාගෙන් ඡායාරූපයක් ගන්නා අවස්ථාවේදී 'ඉනෝකා' යන නිලධාරිනිය දුරකථනය උදුරාගෙන "තමුන් හදන්නෙ අපිවත් අමාරුවෙ දාන්නද" යැයි පැවසූ බවත්, එවිට පොලිස් නිලධාරීන් කිහිප දෙනෙකු පැමිණ තමාගේ සැමියා තල්ලු කර ඔහුගේ කමිසයෙන් ඇද්ද බවත්, කමිසයේ බොත්තම් කිහිපයක් කැඩුණු බවත්, ඔහුගේ ඇස් කණ්නාඩිය ද කඩා දැමූ බවත්, තමා 'ඉනෝකා' යන නිලධාරිනියගෙන් "ඇයි මහත්තයාට ගහන්නේ" යනුවෙන් විමසූ විට, "ඔයාවත් ඇතුළට දානවා" යැයි පැවසූ බවත්, ඉන් පසු සැමියාව පොලිසිය තුළ තබාගෙන තමාව එළියට දැමූ බවත්....." යනුවෙන් සඳහන් කර ඇත. පැමිණිලිකරු වන ජී.එන්.එන්. සඳගල යන අය විසින් සහ ඔහුගේ පුත්‍රයා වන ජී. ඒ. විශ්ව තරණ සඳගල යන දෙදෙනා විසින් ද දිව්රුම් ප්‍රකාශ දෙකක් යොමුකරමින් ඉහත ප්‍රකාශයම ලබාදී ඇත.

එකී දිව්රුම් ප්‍රකාශ හා වගඋත්තර පාර්ශවයේ පරස්පර විරෝධී ප්‍රකාශ අනුව, ජී.එන්.එන්. සඳගල යන අයට මට්ටක්කුලිය පොලිස් ස්ථානයේ චෝදනාගාරය තුළ සිටි හයවන සහ හත්වන වගඋත්තරකාර නිලධාරීන් දෙදෙනා ඇතුළු එහි සිටි අනෙක් පොලිස් නිලධාරීන් විසින් පහරදීමක් සිදුකර ඇති බව පෙනීයයි. එය තවදුරටත් 2024.12.03 දින ජාතික රෝහලේ අධිකරණ වෛද්‍ය නිලධාරීන් රුක්ෂාන් පෙරේරා මහතා විසින් ජී.එන්.එන්. සඳගල යන අය පරීක්ෂා කිරීමෙන් අනතුරුව, මට්ටක්කුලිය පොලිස් ස්ථානය වෙතින් නිකුත් කරන ලද අධිකරණ වෛද්‍ය පෝරම පත්‍රයෙහි "හානිකාරකයේ ස්වභාවය (Nature of causative weapon) යටතේ 'මොට්ට' ලෙස ද, පීඩාවේ ප්‍රභේදය යටතේ "බරපතල නොවන" ලෙස" ද සඳහන් කර තිබීම තුළින් සනාථ වේ.

ඒ අනුව පෙනීයන්නේ, ජී.එන්.එන්. සඳගල යන අය, සිය පුත්‍රයාට පොලිස් නිලධාරීන් විසින් පහරදී ඇති බව දැනගත් පසු එම අවස්ථාවේදී සිය පුත්‍රයා සිටි ස්වරූපය ඡායාරූප ගත කිරීමට යාමේදී එම ස්ථානයේ සිටි නිලධාරීන් විසින් ඔහුගේ දුරකථය ලබාගෙන, ඔහුට පහරදී, රාජකාරියට බාධා කළ බවට අත්අඩංගුවට ගැනීම සිදුකර ඇති බවයි.

නිගමනය :

ජී. ඒ. විශ්ව තරණ සඳගල (වයස අවු. 19) යන අය අත්අඩංගුවට ගැනීම, පහරදීම හා ආයුධයක් ලග තබාගත් බවට නඩු පැවරීම සහ හා ජී. එන්. එන්. සඳගල යන අය අත්අඩංගුවට ගැනීම යන සියලුම කරුණු සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිලි පාර්ශවය විසින් ඉදිරිපත් කරන ලද පැමිණිල්ල හා සාක්ෂි, වගඋත්තර පාර්ශවය විසින් ඉදිරිපත් කරන ලද වාර්තා සහ ප්‍රකාශ, වාර්තා අධිකරණ වෛද්‍ය වාර්තා ඇතුළු සියලුම කරුණු විමර්ශන කිරීමෙන් අනතුරුව, මානව හිමිකම් කොමිෂන් සභාව විසින් මෙම අත්අඩංගුවට ගැනීම් සම්බන්ධයෙන් පහත නිගමන වලට එළඹෙන ලදි.

ඉහත නම් සඳහන් තැනැත්තන් අත්අඩංගුවට ගැනීමට පෙර නීතිය මගින් නියම කර ඇති විධිවිධාන වලට අනුකූලව විධිමත් විමර්ශනයක් සිදුකර කරුණු අනාවරණය කර ගැනීමක් සිදුකර නොමැති බව වගඋත්තර පාර්ශවයන් විසින් ලබාදෙන ලද ප්‍රකාශවල පවතින පරස්පර විරෝධී කරුණු හා වාර්තා කර ඇති සටහන් විමර්ශනය කිරීමේදී අනාවරණය විය. ඒ අනුව ජී. ඒ. විශ්ව තරණ සඳගල හා ජී.එන්.එන්. සඳගල පිය පුතු දෙපළ මට්ටක්කුලිය පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් නිසි විමර්ශනයකින් තොරව අත්අඩංගුවට ගැනීම සිදුකර ඇති බව තහවුරුවන බැවින් **අගතියටපත් තැනැත්තන් දෙදෙනා සම්බන්ධයෙන්, 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්තාවේ III වන පරිච්ඡේදයේ 13 (1) වන ව්‍යවස්ථාව මඟින් සහතික කොට ඇති "නීතියේ නියම කරනු ලැබූ කාර්යය පටිපාටියට අනුකූලව මිස කිසිම තැනැත්තෙකු සිරභාරයට ගැනීම නොකළ යුතතේය" යන මූලික අයිතිවාසිකම, 02 වන වගඋත්තරකරු පො.සැ. 53137 වී.එම්. ආනන්ද ගුණසේකර නිලධාරියා, 03 වන වගඋත්තරකරු පො.කො. රි. 80765 එම්.එච්.ජේ. සකලසූරිය නිලධාරියා සහ 07 වන වගඋත්තරකරු පො.සැ. 74719 ඩබ්.එම්.ආර්.එල්. විජේසිංහ යන නිලධාරීන් විසින් උල්ලංඝනය කර ඇති බවට කොමිෂන් සභාව විසින් මෙයින් නිගමනය කරනු ලැබේ.**

තවද, නීත්‍යානුකූල ක්‍රියාපටිපාටිය අනුගමනය කරමින් කිසියම් සැකකරුවෙකු අත්අඩංගුවට ගත්පසු පැය 24 ක් ඇතුළත අධිකරණයට ඉදිරිපත් කිරීම හෝ ඇප මත මුදාහැරීම සිදු කළ යුතුය. එහෙත් නීත්‍යානුකූල රාමුවෙන් පරිබාහිරව කිසියම් පුද්ගලයෙකු අත්අඩංගුවට ගෙන තිබේ නම්, එවැනි අවස්ථාවකදී එම පුද්ගලයා සුළු වේලාවක් හෝ රඳවා ගැනීම තුළින් ඔහුගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වීම සිදුවේ.

මෙකී සිදුවීමේදී ද වගඋත්තර පාර්ශවය විසින් නිසි විමර්ශනයකින් තොරව සිය බලය අත්තනෝමතික ආකාරයෙන් භාවිතා කරමින් ජී.ඒ. විශ්ව තරණ සඳගල යන අය හා ජී.එන්.එන්. සඳගල යන අය අත්අඩංගුවට ගෙන ඇති බව නිරීක්ෂණය වේ. එසේ නීත්‍යානුකූල ක්‍රියාපටිපාටියට පරිබාහිරව අත්අඩංගුවට ගැනීම නීත්‍යානුකූල නොවන බැවින්, පොලිස් ස්ථානය තුළ ඔවුන් රඳවා තබාගැනීම ද නීත්‍යානුකූල නොවන බව පෙනීයයි. එබැවින් **අගතියටපත් තැනැත්තන් දෙදෙනා සම්බන්ධයෙන්, 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 13 (2) ව්‍යවස්ථාව මඟින් තහවුරු කර ඇති "අත්අඩංගුවෙහි තබාගනු ලැබූ හෝ රඳවා තබා ගනු ලැබූ හෝ අන්‍යාකාරයකින් පෞද්ගලික නිදහස අහිමි කරනු ලැබූ හෝ සෑම තැනැත්තෙකුම නීතියෙන් නියම කරනු ලැබූ කාර්යය පටිපාටිය අනුව ආසන්නතම නිසි අධිකරණයේ විනිශ්චයකාරයා විසින් කරනු ලැබූ ආඥාව මත සහ ආඥාව ප්‍රකාර මිස, ඒ තැනැත්තා තවදුරටත් අත්අඩංගුවෙහි තබාගැනීම හෝ රඳවා තබාගැනීම හෝ ඒ තැනැත්තාගේ පෞද්ගලික නිදහස අහිමි කිරීම හෝ නොකළ යුත්තේය." යන මූලික අයිතිවාසිකම, 01 වන වගඋත්තරකරු ප්‍ර.පො.ප. ආර්.ඒ.ආර්.ඩී. කරුණාරත්න නිලධාරියා සහ 07 වන වගඋත්තරකරු පො.සැ. 74719 ඩබ්.එම්.ආර්.එල්. විජේසිංහ යන නිලධාරීන් විසින් උල්ලංඝනය කර ඇති බවට කොමිෂන් සභාව විසින් මෙයින් නිගමනය කරනු ලැබේ.**

එමෙන්ම විමර්ශනයේදී අනාවරණය වූ සියලුම කරුණු සහ අධිකරණ වෛද්‍ය වාර්තාවල සඳහන් කරුණු අනුව ජී. ඒ. විශ්ව තරණ සඳගල යන අය අත්අඩංගුවට ගැනීමේදී පහරදී කායික තුවාල සිදු කරමින් කෲර සහ අවමන් සහගත සැලකිල්ලකට භාජනය කිරීම හේතුවෙන්, වගඋත්තර පාර්ශවය විසින් **අගතියටපත් පාර්ශවය සම්බන්ධයෙන්, 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 11 වන ව්‍යවස්ථාව මඟින් ප්‍රකාශිත "කිසිදු තැනැත්තෙකු වධහිංසාවකට හෝ කෲර අමානුෂික හෝ අවමන් සහගත සැලකිල්ලකට නැතහොත් දඬුවමකට යටත් නොකළ යුත්තේය" යන මූලික අයිතිවාසිකම 02 වන වගඋත්තරකරු පො. සැ. 53137 වී. එම්. ආනන්ද ගුණසේකර නිලධාරියා, 03 වන වගඋත්තරකරු පො. කො. රි. 80765 එම්. එච්. ජේ. සකලසූරිය නිලධාරියා, 04 වන වගඋත්තරකරු පො. සැ. 12104 ආර්. එස්. කේ. ඒ. ප්‍රියන්ත නිලධාරියා, 06 වන වගඋත්තරකරු පො. කො. 24052 ආර්. ආර්. රාජපක්ෂ නිලධාරියා, 07 වන වගඋත්තරකරු පො. සැ. 74719 ඩබ්.එම්.ආර්.එල්. විජේසිංහ යන නිලධාරීන් විසින් උල්ලංඝනය කර ඇති බවට කොමිෂන් සභාව විසින් මෙයින් නිගමනය කරනු ලැබේ.**

එමෙන්ම, නීතිය මඟින් නියම කර ඇති විධිවිධාන වලට අනුකූලව අපක්ෂපාතී විමර්ශන පටිපාටියක් අනුගමනය නොකිරීම, මෙම අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් සත්‍ය කරුණු වසන් කිරීම හෝ කරුණු සඟවා ප්‍රකාශ කිරීම, අධිකරණයට කරුණු වාර්තා කිරීමේදී අත්තනෝමතික ආකාරයට කටයුතු කිරීම සහ නීතිය හා සාමය ආරක්ෂා කරනු ලබන පොලිස් නිලධාරීන් ලෙස සිය රාජකාරී කටයුතු විනිවිදභාවයකින් තොරව අත්තනෝමතික ආකාරයෙන් සිදු කිරීම, සාමාන්‍ය පුරවැසියෙකුට නීතිය ක්‍රියාත්මක කරන ආයතනයක් තුළදී හිමිවිය යුතු සාධාරණ නීතිමය රැකවරණය අහිමි කිරීම යන වැරදි සිදුකරමින් පැමිණිලිකාර පාර්ශවය සම්බන්ධයෙන්, **1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම**

ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 12 (1) ව්‍යවස්ථාව මඟින් තහවුරු කර ඇති "නීතිය පසිදලීම සහ ක්‍රියාත්මක කිරීම ද නීතියේ රැකවරණය ද සර්ව සාධාරණ විය යුත්තේය" යන මූලික අයිතිවාසිකම් 01 වන වගඋත්තරකරු ප්‍ර. පො. ප. ආර්. ඒ. ආර්. ඩී. කරුණාරත්න නිලධාරියා, 02 වන වගඋත්තරකරු පො. සැ. 53137 වී. එම්. ආනන්ද ගුණසේකර නිලධාරියා, 04 වන වගඋත්තරකරු පො. සැ. 12104 ආර්. එස්. කේ. ඒ. ප්‍රියන්ත නිලධාරියා, 05 වන වගඋත්තරකරු කා. පො. සැ. 3429 ටී. එම්. ඉනෝකා සුහාරිස් නිලධාරිනිය, 07 වන වගඋත්තරකරු පො. සැ. 74719 ඩබ්. එම්. ආර්. එල්. විජේසිංහ යන නිලධාරීන් විසින් උල්ලංඝනය කර ඇති බවට කොමිෂන් සභාව විසින් මෙයින් නිගමනය කරනු ලැබේ.

නිර්දේශ :

ඉහත නිගමන අනුව වගඋත්තර පාර්ශවයන් විසින්, 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 11 වන ව්‍යවස්ථාව, 12 (1) ව්‍යවස්ථාව, 13 (1) හා 13(2) ව්‍යවස්ථාව යන මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් පහත දැක්වෙන නිර්දේශ නිකුත් කරනු ලැබේ.

01. මට්ටක්කුලිය පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයා ලෙස කටයුතු කරමින් ආයතනයේ අධීක්ෂණ භාර නිලධාරියා ලෙස සිය රාජකාරි නිසි ලෙස ඉටු නොකිරීම, විධිමත් විමර්ශනයකින් තොරව පුද්ගලයන් දෙදෙනෙකු අත්අඩංගුවට ගැනීමෙන් පසු නීත්‍යානුකූල නොවන පරිදි රඳවා තබාගැනීම තුළින් පළමු වගඋත්තරකරුවන ප්‍ර.පො.ප. ආර්.ඒ.ආර්.ඩී. කරුණාරත්න නිලධාරියා විසින් පිළිවෙළින් ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) සහ 13(2) යන ව්‍යවස්ථාවන් උල්ලංඝනය කර ඇති බවට තහවුරුවී ඇත. ඒ අනුව පළමුවන වගඋත්තරකරුවන ප්‍ර.පො.ප. ආර්.ඒ.ආර්.ඩී. කරුණාරත්න නිලධාරියා විසින් රු. 10,000/- ක මුදලක් අගතියටපත් පාර්ශවය වෙත ගෙවිය යුතුය. අදාළ ගෙවීම් සිදුකර පළමුවන වගඋත්තරකරු විසින් ඒ පිළිබඳව කොමිෂන් සභාව දැනුවත් කළ යුතුය.

02. විධිමත් විමර්ශනයකින් තොරව පුද්ගලයන් දෙදෙනෙකු අත්අඩංගුවට ගැනීම, අත්අඩංගුවට ගැනීමේදී පහරදී කායික තුවාල සිදු කරමින් කෲර සහ අවමන් සහගත සැලකිල්ලකට භාජනය කිරීම, අත්තනෝමතික ආකාරයට සිය බලය භාවිතා කිරීම යන වැරදි සිදුකරමින් දෙවන වගඋත්තරකරුවන පො.සැ. 53137 වී.එම්. ආනන්ද ගුණසේකර නිලධාරියා විසින් පිළිවෙළින් ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13(1), 11 සහ 12(1), යන ව්‍යවස්ථාවන් උල්ලංඝනය කර ඇති බවට තහවුරුවී ඇත. ඒ අනුව දෙවන වගඋත්තරකරුවන පො.සැ. 53137 වී.එම්. ආනන්ද ගුණසේකර නිලධාරියා විසින් රු. 10,000/- ක මුදලක් අගතියටපත් පාර්ශවය වෙත ගෙවිය යුතුය. අදාළ ගෙවීම් සිදුකර දෙවන වගඋත්තරකරු විසින් ඒ පිළිබඳව කොමිෂන් සභාව දැනුවත් කළ යුතුය.

03. විධිමත් විමර්ශනයකින් තොරව පුද්ගලයන් දෙදෙනෙකු අත්අඩංගුවට ගැනීමට සහයවීම, අත්අඩංගුවට ගැනීමේදී පහරදී කායික තුවාල සිදු කරමින් කෲර සහ අවමන් සහගත සැලකිල්ලකට භාජනය කිරීම, අත්තනෝමතික ආකාරයට සිය බලය භාවිතා කිරීම යන වැරදි සිදුකරමින් තෙවන වගඋත්තරකරුවන පො.කො.රි. 80765 එම්.එච්.ජේ. සකලසූරිය නිලධාරියා විසින් ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13(1) සහ 11 යන ව්‍යවස්ථාවන් උල්ලංඝනය කර ඇති බවට තහවුරුවී ඇත. ඒ අනුව තෙවන වගඋත්තරකරුවන පො.කො.රි. 80765 එම්.එච්.ජේ. සකලසූරිය නිලධාරියා විසින් රු. 10,000/- ක මුදලක් අලතියටපත් පාර්ශවය වෙත ගෙවිය යුතුය. අදාළ ගෙවීම් සිදුකර තෙවන වගඋත්තරකරු විසින් ඒ පිළිබඳව කොමිෂන් සභාව දැනුවත් කළ යුතුය.

04. උසාවි භාර නිලධාරියා වශයෙන් අධිකරණයට කරුණු වාර්තා කිරීමේදී අත්තනෝමතික ආකාරයට සිය රාජකාරී කටයුතු සිදු කිරීම, පහරදී කායික තුවාල සිදු කරමින් කෲර සහ අවමන් සහගත සැලකිල්ලකට භාජනය කිරීම, අත්තනෝමතික ආකාරයට සිය බලය භාවිතා කිරීම යන වැරදි සිදුකරමින් හතරවන වගඋත්තරකරුවන පො.සැ. 12104 ආර්. එස්. කේ. ඒ. ප්‍රියන්ත නිලධාරියා විසින් පිළිවෙලින් ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 සහ 12(1) යන ව්‍යවස්ථාවන් උල්ලංඝනය කර ඇති බවට තහවුරුවී ඇත. ඒ අනුව හතරවන පො.සැ. 12104 ආර්. එස්. කේ. ඒ. ප්‍රියන්ත නිලධාරියා විසින් රු. 5,000/- ක මුදලක් අගතියටපත් පාර්ශවය වෙත ගෙවිය යුතුය. අදාළ ගෙවීම් සිදුකර හතරවන වගඋත්තරකරු විසින් ඒ පිළිබඳව කොමිෂන් සභාව දැනුවත් කළ යුතුය.

05. රාජකාරී කටයුතු නිසි ලෙස ඉටු නොකිරීම, අත්තනෝමතික ආකාරයට සිය බලය භාවිතා කිරීම යන වැරදි සිදුකරමින් පස්වන වගඋත්තරකාරිය පො. සැ. 3429 ටී. එම්. ඉනෝකා සුභාරිස් නිලධාරිනිය විසින් ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව උල්ලංඝනය කර ඇති බවට තහවුරුවී ඇත. ඒ අනුව පස්වන වගඋත්තරකාරිය පො. සැ. 3429 ටී. එම්. ඉනෝකා සුභාරිස් නිලධාරිනිය විසින් රු. 10,000/- ක මුදලක් අගතියටපත් පාර්ශවය වෙත ගෙවිය යුතුය. අදාළ ගෙවීම් සිදුකර පස්වන වගඋත්තරකරු විසින් ඒ පිළිබඳව කොමිෂන් සභාව දැනුවත් කළ යුතුය.

06. අත්අඩංගුවට ගැනීමේදී පහරදී කායික තුවාල සිදු කරමින් කෲර සහ අවමන් සහගත සැලකිල්ලකට භාජනය කිරීම, අත්තනෝමතික ආකාරයට සිය බලය භාවිතා කිරීම යන වැරදි සිදුකරමින් හයවන වගඋත්තරකරුවන පො. කො. 24052 ආර්. ආර්. රාජපක්ෂ නිලධාරියා විසින් ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 ව්‍යවස්ථාව උල්ලංඝනය කර ඇති බවට තහවුරුවී ඇත. ඒ අනුව හයවන වගඋත්තරකරුවන පො. කො. 24052 ආර්. ආර්. රාජපක්ෂ නිලධාරියා විසින් රු. 10,000/- ක මුදලක් අගතියටපත් පාර්ශවය වෙත ගෙවිය යුතුය. අදාළ ගෙවීම් සිදුකර හයවන වගඋත්තරකරු විසින් ඒ පිළිබඳව කොමිෂන් සභාව දැනුවත් කළ යුතුය.

07. විධිමත් විමර්ශනයකින් තොරව පුද්ගලයෙකු අත්අඩංගුවට ගැනීම, රඳවා තබාගැනීම, අත්අඩංගුවට ගැනීමේදී පහරදී කායික තුවාල සිදු කරමින් කෲර සහ අවමන් සහගත සැලකිල්ලකට භාජනය කිරීම, අත්තනෝමතික ආකාරයට සිය බලය භාවිතා කිරීම යන වැරදි සිදුකරමින් හත්වන වගඋත්තරකරුවන පො. සැ. 74719 ඩබ්. එම්. ආර්. එල්. විජේසිංහ නිලධාරියා විසින් පිළිවෙළින් ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13(1), 13(2), 11 සහ 12(1) යන ව්‍යවස්ථාවන් උල්ලංඝනය කර ඇති බවට තහවුරුවී ඇත. ඒ අනුව හත්වන වගඋත්තරකරුවන පො. සැ. 74719 ඩබ්. එම්. ආර්. එල්. විජේසිංහ නිලධාරියා විසින් රු. 10,000/- ක මුදලක් අගතියටපත් පාර්ශවය වෙත ගෙවිය යුතුය. අදාළ ගෙවීම් සිදුකර හත්වන වගඋත්තරකරු විසින් ඒ පිළිබඳව කොමිෂන් සභාව දැනුවත් කළ යුතුය.

පොලිස්පතිවරයා විසින්,

- ජී. ඒ. විශ්ව තරණ සඳගල (වයස අවු. 19) හා ජී. එන්. එන්. සඳගල යන තැනැත්තන් අත්අඩංගුවට ගැනීම සහ පහරදීම සම්බන්ධයෙන් මෙම පැමිණිල්ලේ වගඋත්තර පාර්ශවය වශයෙන් හඳුනාගෙන ඇති, 01 වන වගඋත්තරකරු ප්‍ර.පො.ප. ආර්.ඒ.ආර්.ඩී. කරුණාරත්න නිලධාරියා, 02 වන වගඋත්තරකරු පො.සැ. 53137 වී.එම්. ආනන්ද ගුණසේකර නිලධාරියා, 03 වන වගඋත්තරකරු පො.කො.රි. 80765 එම්.එච්.ජේ. සකලසූරිය නිලධාරියා, 04 වන වගඋත්තරකරු පො.සැ. 12104 ආර්.එස්.කේ.ඒ. ප්‍රියන්ත නිලධාරියා, 05 වන වගඋත්තරකරු කා පො.සැ. 3429 ටී.එම්. ඉනෝකා සුහාරිස් නිලධාරිනිය, 06 වන වගඋත්තරකරු පො.කො. 24052 ආර්.ආර්. රාජපක්ෂ නිලධාරියා, 07 වන වගඋත්තරකරු පො.සැ. 74719 ඩබ්.එම්.ආර්.එල්. විජේසිංහ යන නිලධාරීන් සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වා සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට කටයුතු කළ යුතුය. එසේ ගනු ලබන ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත දැනුම්දිය යුතුය.

- තවද හතරවන වගඋත්තරකරුවන පො.සැ. 12104 ආර්. එස්. කේ. ඒ. ප්‍රියන්ත නිලධාරියා මෙම සිදුවීම වන අවස්ථාවේදී පොලිස් ස්ථානය තුළ නොසිටි බවට ප්‍රකාශ කර තිබුණද, අගතියටපත් ජී.ඒ. විශ්ව තරණ සඳගල යන අයගේ ප්‍රකාශයෙහි එම නිලධාරියා විසින් පොලිස් ස්ථානය තුළදී පහරදුන් බව ප්‍රකාශ කර ඇති බැවින්, එකී කරුණ සම්බන්ධයෙන් විමර්ශනයක් සිදුකර සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට කටයුතු කළ යුතුය. එසේ ගනු ලබන ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත දැනුම්දිය යුතුය.

- සැකකරුවන් සම්බන්ධයෙන් අධිකරණයට චෝදනා පත්‍ර යොමු කිරීමේදී, මට්ටක්කුලිය පොලිස් ස්ථානයේ ප්‍ර.පො.ප. නලින් චම්මික විජේවර්ධන (ස්ථානාධිපතිවරයා) නිලධාරියා විසින්, සැකකරුගෙන් ප්‍රකාශ සටහන්කරගෙන තිබේද යන්න සම්බන්ධයෙන් අධීක්ෂණය කිරීමකින් තොරව, වගඋත්තරකාර නිලධාරීන්ගේ විමර්ශන වාර්තා නිසි පරීක්ෂාවකට ලක් නොකර, අදාළ චෝදනා පත්‍ර නිකුත් කිරීම සිදුකර ඇති බව පෙනීයයි. එම ක්‍රියාව තුළින් පොලිස් ස්ථානයේ අධීක්ෂණ භාර නිලධාරියා වශයෙන් ප්‍ර.පො.ප. නලින් චම්මික විජේවර්ධන (ස්ථානාධිපතිවරයා)

මහතා සිය රාජකාරී කටයුතු නිසි අයුරින් ඉටු නොකිරීම සම්බන්ධයෙන්, සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට කටයුතු කළ යුතුය. එසේ ගනු ලබන ක්‍රියාමාර්ග සම්බිනධයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත දැනුම්දිය යුතුය.

2026..11..26.......... වන දිනට පෙර මෙකී නිර්දේශ ක්‍රියාත්මක කර ඒ සම්බන්ධයෙන් වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්ති ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම, එකී නිර්දේශ ක්‍රියාත්මක කර ඉදිරිපත් කිරීමට නියමිත දින සිට සතියක කාලයක් තුළ මෙම නිර්දේශ ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකාර පාර්ශවය විසින් ද කොමිෂන් සභාවට දැනුම් දිය යුතුය.

එල්.ටී.බී. දෙහිදෙණිය,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (හිටපු)
සභාපති.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත :-

01. අමාත්‍යතුමා, - කා.දැ.ගැ.ස.
මහජන ආරක්ෂක අමාත්‍යාංශය,
04 වන මහල, සුහුරුපාය, බත්තරමුල්ල.

02. ලේකම්, - ඉහත නිර්දේශ ප්‍රකාරව පියවර ගැනීමට.
මහජන ආරක්ෂක අමාත්‍යාංශය,
04 වන මහල, සුහුරුපාය, බත්තරමුල්ල.

03. පොලිස්පති, - ඉහත නිර්දේශ ප්‍රකාරව පියවර ගැනීමට.
පොලිස් මූලස්ථානය, කොළඹ 01.

04. සභාපති, - අ.ක.ස.
ජාතික පොලිස් කොමිෂන් සභාව,
අංක 09 ගොඩනැගිල්ල, BMICH පරිශ්‍රය,
බෞද්ධාලෝක මාවත, කොළඹ 07.

05. අධ්‍යක්ෂ, - අ.ක.ස.
මානව හිමිකම් කොට්ඨාශය,
මුක්තාර් ප්ලාසා ගොඩනැගිල්ල, 05වන මහල, ග්‍රෑන්ඩ්පාස් පාර, කොළඹ 12.

සැ.යු. - අදාළ මුදල "මුදල් ඇණවුමක්" මඟින් පැමිණිලිකරු වෙත ගෙවා එහි පිටපතක් කොමිෂන් සභාවට ලැබීමට සැලැස්විය යුතුය.